# තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

# 2025

# ප්‍රගති වාර්තාව

# පටුන


| | | |
|---|---|---|
| 01. | තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය | 1-10 |
| 02. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 11-16 |
| 03. | ජාතික තරුණ සේවා සභාව | 17-26 |
| 04. | ජාතික යොවුන් සේනාංකය | 27-36 |
| 05. | නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය | 37-44 |
| 06. | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 45-52 |
| 07. | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය | 53-60 |
| 08. | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | 61-70 |
| 09. | ක්‍රීඩා වෛද්‍ය ආයතනය | 71-80 |

# තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

**01.** හැඳින්වීම

අභිමානවත් තුළිත පෞරුෂත්වයකින් යුත් ජවසම්පන්න තරුණ ප්‍රජාවක් හා නීරෝගීමත්, විනයගරුක සමාජයක් බිහිකිරීම සඳහා ක්‍රියාශීලී පරපුරක් නිර්මාණය කිරීමට රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූල වන පරිදි හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව තරුණ ප්‍රජාව හා ක්‍රීඩාව කේන්ද්‍ර කරගනිමින් තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ කාර්යයන් සිදු කෙරේ. ක්‍රීඩා හා යෞවන කටයුතු ලෙස පැවැති අමාත්‍යාංශ නාමය අංක 2412/08-2024 දරණ හා 2024 නොවැම්බර් මස 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය ලෙස සංශෝධනය විය.

**02.** දැක්ම

'ජවසම්පන්න තාරුණ්‍යය තුළින් තිරසර ලෙස සංවර්ධිත දේශයක්'

**03.** මෙහෙවර

ජාතික ආර්ථිකයට සක්‍රියව දායකත්වයක් ලබාදෙන තරුණ ප්‍රජාවක් බිහිකිරීම හා විනය ගරුක, ක්‍රීඩාශීලී සමාජයක් ඇතිකිරීම තුළින් ඒකාබද්ධ හා සමෘද්ධිමත් දේශයක් ගොඩනැඟීමට දායක වීම.

**04.** ප්‍රධාන කාර්යයන්

i. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා තරුණ කටයුතු සහ ක්‍රීඩා විෂයන්ට සහ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

ii. අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.

iii. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යයභාරය ඉටු කිරීම සහතික කරනු වස් නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියළු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම

iv. රැකියා විරහිත තරුණ තරුණියන් පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා දත්ත පද්ධතියක් පිහිටුවීම සහ ඔවුන් ස්ථානගත කිරීම සඳහා රැකියා බැංකුවක් පිහිටුවීම සහ විරැකියාව ක්‍රමානුකූලව අවම කිරීම සඳහා මාර්ගගත වේදිකාවක් මඟින් අදාළ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම.

v. තරුණ පරපුරේ අභිලාෂයන් ඉටු වන ජාතික වැඩපිළිවෙළක් අරමුණු කර ගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

vi. රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

vii. විවිධ ජාතීන් හා ආගම් අතර අවබෝධය වර්ධනය කිරීම සඳහා තරුණ හුවමාරු වැඩසටහන් නිර්මාණය කිරීම.

viii. තරුණ සංවිධාන සම්බන්ධ නියාමන හා සංවර්ධන කටයුතු.

ix. තාරුණ්‍යයේ නිපුණතා, කුසලතා හා නිර්මාණශීලිත්වය සමාජ පිළිගැනීමක් ඇති වන සහ ඔවුන්ට සිය අභිමතාර්ථ දියුණු කරගත හැකි වන සේ තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් විශේෂ වැඩසටහන් සම්පාදනය කිරීම.

x. තරුණ ව්‍යවසායකයින් බිහි කිරීමට පියවර ගැනීම සහ ඔවුන්ට අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් සලසා දීම සඳහා ක්‍රමවේද හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම.

xi. උසස් පෙළ සමත්, නමුත් රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් විය නොහැකි වූ තරුණ ප්‍රජාව ඉලක්ක කර වෘත්තීය නිපුණතාවයක් සහිත තාක්ෂණික අධ්‍යාපනය ලබා දීම.

xii. දැනටමත් මාර්ගගත ක්‍රමය ඔස්සේ විදේශ විනිමය උපයන නිදහස් වෘත්තික (Freelance) තරුණ තරුණියන්ට ඒ සඳහා ඇති බාධාවන් ඉවත් කිරීම.

xiii. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

xiv. ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා සානුබලයන් සැපයීම.

xv. ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණය ප්‍රවර්ධනය කිරීම.

xvi. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැගීම සඳහා ක්‍රීඩාව යොදා ගැනීමට හැකි වන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xvii. ක්‍රීඩක ක්‍රීඩිකාවන් අන්තර්ජාතික තරඟවලට සහභාගී වීමට ඇති අවස්ථාවන් පුළුල් කිරීම.

xviii. පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදු කිරීම.

xix. ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රීඩාවේදී තහනම් උත්තේජක භාවිතය මැඩලීම සඳහා ක්‍රියා කිරීම.

xx. ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම.

xxi. ක්‍රීඩා සමිති සංවිධාන සහ ක්‍රීඩා තරඟාවලි ප්‍රවර්ධනය කිරීම.

xxii. ක්‍රීඩා සඳහා විශේෂ දක්ෂතා ඇති ක්‍රීඩකයන් හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ ආර්ථික මට්ටම, පෝෂණය සහ පුහුණුවට අදාළ උපකරණ ලබා දීම සඳහා පාසල් සහ දිස්ත්‍රික්ක මට්ටමින් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xxiii. ජාතික ක්‍රීඩා පුහුණු පාසලක් කේන්ද්‍රකොට ගනිමින් පළාත් නවය සඳහාම නවීන ක්‍රීඩා පාසල් ජාලයක් ඇති කිරීම.

xxiv. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියළුම විෂයන්ට අදාළ කටයුතු සහ එම සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම.

## 05. අදාළ ආයතනික හා නෛතික රාමුව

අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන

i. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
ii. ජාතික තරුණ සේවා සභාව
iii. ජාතික යොවුන් සේනාංකය
iv. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය
v. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
vi. ජාතික ක්‍රීඩා විද්‍යායතනය
vii. ක්‍රීඩා වෛද්‍ය ආයතනය
viii. උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

## 06. ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්

i. ක්‍රීඩාවට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත (2019 අංක 24)
ii. ජාතික රාජ්‍ය සභාවේ ක්‍රීඩා පනත (1973 අංක 25)
iii. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරී පනත (1999 අංක 17)
iv. ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33)
v. ජාතික තරුණ සේවා සභා පනත (1979 අංක 69)
vi. ජාතික යොවුන් සේනාංක පනත (2002 අංක 21)
vii. ළමයින් හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥා පනත (1939 අංක 48)

**07.** මානව සම්පත් පැතිකඩ

අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය 2025.09.30 දිනට

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 40 | 29 | 11 |
| තෘතීයික | 05 | 03 | 02 |
| ද්විතියික | 200 | 164 | 36 |
| ප්‍රාථමික | 055 | 049 | 06 |
| එකතුව | **300** | **245** | **55** |

**08.** ජාතික ක්‍රීඩා අරමුදල

ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ධෛර්ය දීම, ක්‍රීඩාව දියුණු කිරීම, සංවර්ධනය කිරීම සඳහා ආධාර හා අනුබල දීමේ අරමුණින් 1973 අංක 250 දරණ ක්‍රීඩා පනතේ විධි විධාන අනුව ජාතික ක්‍රීඩා අරමුදලින් පෝෂණ දීමනා ගෙවීම්, ජාත්‍යන්තර ජයග්‍රහණ වෙනුවෙන් සිදුකරන ත්‍යාග ලබාදීම්, ක්‍රීඩා සංගම් සඳහා මුදල් ලබාදීම් සිදුකරනු ලබයි. ජාතික ක්‍රීඩා අරමුදල සඳහා මූල්‍ය ප්‍රභවය වනුයේ භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන හා ජාතික ලොතරැයි මණ්ඩලය මඟින් ලබන වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදනයි.

ක්‍රීඩා අරමුදලේ අරමුණු

i. ජාතික ක්‍රීඩා අරමුදල මගින් ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීමට අදාළ ප්‍රතිපත්ති හා පසුවිපරම් ක්‍රමවේදය සැකසීම.
ii. ක්‍රීඩාවේ උන්නතිය උදෙසා ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් ක්‍රීඩා අරමුදලේ ප්‍රතිපාදන කඩිනමින් ලබාදීම.
iii. ක්‍රීඩා අරමුදල සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අනුග්‍රාහකත්වය ලබා ගැනීම තුළින් ක්‍රීඩා අරමුදල ශක්තිමත් කිරීම සහ එමඟින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වැඩි ප්‍රමාණයකට අරමුදල යටතේ ප්‍රතිපාදන ලබාදීම.
iv. පදක්කම්ලාභීන් අගයමින් විශේෂ තිළිණ ලබා දීම තුළින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් තුළ උද්යෝගයක් ඇතිකිරීම.

**09. 2025.09.30** දිනට ළඟාකරගත් ඉලක්ක

i. දිවයිනම ආවරණය වන පරිදි 2025 ක්‍රීඩා සතිය (2025.07.26 සිට 2025.07.31 දක්වා) වැඩ සටහන සාර්ථකව පවත්වා අවසන් කිරීම.
ii. ක්‍රීඩා රෙගුලාසි ප්‍රකාරව ජාතික ක්‍රීඩා සම්මේලන වලට අදාළව 2025.01.01 - 2025.09.30 දක්වා ජාතික තේරීම් කමිටු 07ක් පත් කිරීම.
iii. පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන යටතේ පාසල් 220කට ක්‍රිකට් ක්‍රීඩා භාණ්ඩ බෙදා දීම.
iv. ජාතික තරුණ ප්‍රතිපත්තිය සකස් කිරීම එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ දායකත්වය මත ක්‍රියාත්මක කරනු ලැබේ. එම අරමුදල යටතේ තරුණ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා උපදේශකවරියක් බඳවා ගැනීම සිදු කර ඇති අතර විවිධ අමාත්‍යාංශ මට්ටමින් තාරුණ්‍යය සඳහා ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී. පුවත්පත් දැන්වීම් හා සමාජ මාධ්‍ය හරහා තරුණ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අදහස් විමසීම 2025.11.20 වන දින දක්වා ක්‍රියාත්මක වේ. ජාතික තරුණ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය හා විවිධ අමාත්‍යාංශ එක්ව විධායක කමිටුවක් ද පත්කර ඇත.

**10.** මානව සම්පත් සංවර්ධනය **2025.09.30** දිනට

| අ/අ | වැඩසටහනේ නම | වෙන්කළ මුදල (රු.මිලි.) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මි) | 2025.09.30ට | | |
|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.) | මූල්‍ය ප්‍රගතිය(%) | භෞතික ප්‍රගතිය (%) |
| 1 | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් | 1.00 | - | 0.78 | 72 | 100 |

**11.**වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනිමේ කාර්යසාධනය **2025.09.30** දිනට

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | 2024.12.31 දිනට සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | |
|---|---|---|---|
| | | මූල්‍ය ප්‍රගතිය | % |
| පුනරාවර්තන වියදම | 556.60 | 263.53 | 47 |
| ප්‍රාග්ධන වියදම | 132.00 | 8.12 | 6 |
| **එකතුව** | **688.60** | **271.65** | **39** |

**12. 2025** වර්ෂයේ ලබාගත් විශේෂ ජයග්‍රහණ

i. මළල ක්‍රීඩා ලෝක ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් රුමේෂ් තරංග ක්‍රීඩකයා 7වන ස්ථානය ලබා ගැනීම.

ii. පොදු රාජ්‍ය මණ්ඩලීය බර ඉසිලීමේ ශූරතාවලියේ ජ්‍යෙෂ්ඨ අංශයේ ලෝකඩ පදක්කමක්, කණිෂ්ඨ අංශයෙන් රිදී පදක්කමක්, ලෝකඩ පදක්කම් තුනක්, යොවුන් අංශයෙන් රිදී පදක්කම් පහක්, ලෝකඩ පදක්කම් හතරක් ලබා ගැනීම

iii. දකුණු ආසියානු ශූරතාවලියේ රග්බි පිරිමි කණ්ඩායම දෙවන ස්ථානය ලබා ගැනීම

iv. ආසියානු ජ්‍යෙෂ්ඨ රග්බි ශූරතාවලියේ හතරවන ස්ථානය ලබා ගැනීම

v. පොදු රාජ්‍ය මණ්ඩලීය වෙරළ අත්පන්දු ශූරතාවලියේ දෙවන ස්ථානය ලබා ගැනීම

vi. Mr. Universe 2025 කායවර්ධන සහ ශාරීරික යෝග්‍යතා ශූරතාවලියේ දී රන් පදක්කම් හතරක්, රිදී පදක්කම් හතරක් සහ ලෝකඩ පදක්කම් හයක් ලබා ගැනීම.

## 13. ඉදිරි ඉලක්ක 2026 – 2029

i. ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් තරුණ අවස්ථා ඉහළ නැංවීම.

ii. දළ ජාතික නිෂ්පාදනයට ක්‍රීඩා ආර්ථිකයේ දායකත්වය ඉහල නැංවීම

iii. නිරෝගිමත් ජන සමාජයක් උදෙසා සෑම පුරවැසියෙක්ම ශාරීරික ක්‍රියාකාරකමකට හෝ ක්‍රීඩාවකට යොමු කිරීම

iv. ද්විපාර්ශවීය අවබෝධතා ගිවිසුම් තුළින් විදේශ රටවල් සමඟ ක්‍රීඩා හා තරුණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

v. තරුණ ප්‍රතිපත්තිය එළි දැක්වීම.

vi. තරඟකාරී ක්‍රීඩා සංවර්ධනය තුළින් ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

DSD

Department of Sports Development

# ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

# ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

**1. හැඳින්වීම**

1960 දශකයේ දී කුඩා ඒකකයක් ලෙස ආරම්භ කරන ලද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, 1970 දි අරඹන ලද පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතට ගෙන, 1996 දී ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් බවට උසස් විය.

මේ වන විට තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව වෙනුවෙන් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් නොනිමි මෙහෙවරක යෙදෙන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, පසුගිය දශක කිහිපයක් වූ සිය ඉතිහාසයේ ක්‍රීඩාව හා බැඳුණු අමාත්‍යාංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක වී ඇත.

**2. දැක්ම**

“ක්‍රීඩාවේ සංවර්ධනය තුළින් ආසියාවේ අභිමානවත් ජාතියක් බවට පත්වීම.”

**3. මෙහෙවර**

ක්‍රීඩාවේ යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනයට අදාල උපාය මාර්ගික මෙහෙයුම් ක්‍රියාවට නැගීම තුළින් ක්‍රීඩා සංස්කෘතියක් බිහිකිරීමත්, නිරෝගී, විනයගරුක ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහිකිරීමත් මගින් රටේ සංවර්ධනය ළඟා කර ගනිමින් ශ්‍රී ලංකාව ආසියාවේ අභිමානවත් ජාතිය බවට පත්කිරීම.

**4. අරමුණු**

i. සමාජයේ සියළුම ස්ථරයන්ට ක්‍රීඩාව සඳහා යොමුවීමට අවකාශය ලබා දීම තුළින් ශාරීරික සුවතාවය, ඵලදායිතාවය හා තෘප්තිය වර්ධනය කිරීම.

ii. ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ජයග්‍රහණ අත් කර ගැනීම.

iii. ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තලයට ගෙන යා හැකි අන්තර්ජාතික මට්ටමේ දැනුමැති දේශීය පුහුණුකරුවන් බිහි කිරීම.

iv. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා පහසුකම් ලබා දීම.

v. ක්‍රීඩා සංගම් නියාමනය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන් ඇති කිරීම.

**5. ප්‍රධාන කාර්යයන්**

**5.1 මානව සම්පත් සංවර්ධනය**

i. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දිම.

ii. ක්‍රීඩක ක්‍රීඩිකාවන් දේශිය හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩා තරඟවලට යොමුකිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.

iii. ක්‍රීඩා පුහුණුකරුවන්ට හා ක්‍රීඩා නිලධාරීන්ට විදේශ පුහුණුව ලබාදීම.

iv. විදේශ පුහුණුකරුවන් හරහා ශ්‍රී ලාංකික පුහුණුකරුවන්ට පුහුණුව ලබාදීම.

v. ක්‍රීඩා නිලධාරින්ට නව තාක්ෂණය හඳුන්වාදිම සඳහා වැඩමුළු සංවිධානය කිරීම.

vi. දේශීය හා විදේශීය ක්‍රීඩා විශේෂඥයන් ලවා ක්‍රීඩා නිලධාරීන්ට හා පුහුණුකරුවන්ට ක්‍රීඩා සම්මන්ත්‍රණ පැවැත්වීම.

### 5.2 යටිතල පහසුකම් සංවර්ධනය

i. අන්තර්ජාතික ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම හා දෙපාර්තමේන්තුව සතු ක්‍රීඩා සංකීර්ණ පවත්වා ගෙන යාම.

ii. ලංකාවේ සෑම පළාතකම ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩාංගන සංවර්ධනය හා නවීකරණය.

iii. ග්‍රාමීය හා පාසල් ක්‍රීඩාපිටි සංවර්ධනය.

## 6. මානව සම්පත් පැතිකඩ :

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 17 | 10 | 07 |
| තෘතියික | 23 | 08 | 15 |
| ද්විතියික | 254 | 172 | 82 |
| ප්‍රාථමික | 101 | 78 | 23 |
| **එකතුව** | **395** | **268** | **127** |

## 7. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන්කළ මුදල (රු. මිලි) | ප්‍රතිසංශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මිලි) | 2025.09.30 දිනට | | |
|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි) | භෞතික ප්‍රගතිය | (%) |
| 01 | පළාත් ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය | 880.00 | - | 178.81 | 20.31 | 93 |
| 02 | දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය | 455.00 | - | 113.35 | 24.91 | 97 |
| 03 | ජාත්‍යන්තර ක්‍රීඩා තරග සඳහා ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම. | 150.00 | - | 101.14 | 67 | 40 |
| 04 | ක්‍රීඩා ශක්ති වැඩසටහන | 200.00 | - | 27.20 | 70 | 25 |
| 05 | ජාත්‍යන්තර ක්‍රීඩා තරග | 500.00 | - | 49.29 | 10 | 20 |
| 06 | ජාතික ක්‍රීඩා තරගාවලිය | 200.00 | - | 152.16 | 76 | 85 |
| 07 | ඉහළ කාර්ය සාධනයක් සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පහසුකම් සැලසීම | 150.00 | - | 53.63 | 36 | 50 |
| 08 | ග්‍රාමීය පාසැල් හා යෞවන සමාජ සඳහා ක්‍රීඩා යටිතල පහසුකම් | 300.00 | - | 0.00 | 0 | 8 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ලබා දීමේ වැඩසටහන - 2025 | | | | | |
| 09 | ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීම. | 200.00 | - | 0.00 | 0 | 10 |
| 10 | ක්‍රීඩා සංස්කෘතිය | 500.00 | - | 0.00 | 0 | 11 |

## 8. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ( 2025.09.30 දිනට)

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු. මිලි) | ප්‍රතිසංශෝධිත අයවැය ඇස්තමේන්තුව | 2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ( රු.මිලි ) | (%) |
| පුනරාවර්තන වියදම | 2670.00 | - | 888.85 | 33.29 |
| ප්‍රාග්ධන වියදම | 2860.00 | - | 356.42 | 12.46 |
| **එකතුව** | **5530.00** | **-** | **1245.27** | **22.52** |

## 9. 2025 වර්ෂයේ ලබාගත් විශේෂ ජයග්‍රහණ

i. මළල ක්‍රීඩා ලෝක ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් රුමේෂ් තරංග ක්‍රීඩකයා 7 වන ස්ථානය ලබා ගැනීම.

ii. පොදු රාජ්‍ය මණ්ඩලීය බරඉසිලීමේ ශූරතාවලියේ ජ්‍යෙෂ්ඨ අංශයේ ලෝකඩ පදක්කමක්, කණිෂ්ඨ අංශයෙන් රිදී පදක්කමක්, ලෝකඩ පදක්කම් තුනක්, යොවුන් අංශයෙන් රිදී පදක්කම් පහක්, ලෝකඩ පදක්කම් හතරක් ලබා ගැනීම.

iii. දකුණු ආසියානු ශූරතාවලියේදී රග්බි පිරිමි කණ්ඩායම දෙවන ස්ථානය ලබා ගැනීම.

iv. ආසියානු ජ්‍යෙෂ්ඨ රග්බි ශූරතාවලියේ හතරවන ස්ථානය ලබා ගැනීම.

v. පොදු රාජ්‍ය මණ්ඩලීය වෙරළ අත්පන්දු ශූරතාවලියේ දෙවන ස්ථානය ලබා ගැනීම.

vi. Mr. Universe 2025 කායවර්ධන සහ ශාරීරික යෝග්‍යතා ශූරතාවලියේ දී රන් පදක්කම් හතරක්, රිදී පදක්කම් හතරක් සහ ලෝකඩ පදක්කම් හයක් ලබා ගැනීම.




මළල ක්‍රීඩා ලෝක ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් රුමේෂ් තරංග ක්‍රීඩකයා 7වන ස්ථානය ලබා ගැනීම




**දිලංක ඉසුරු කුමාර පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල**

## 10. 2026-2029 ඉදිරි ඉලක්ක

i. 2026 වර්ෂයේ ජපානයේ දී පැවැත්වීමට නියමිත ආසියානු ක්‍රීඩා උළෙල සහ 2026 වර්ෂයේ එක්සත් රාජධානියේ පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ දී පදක්කම් ලබා ගැනීම.

ii. 2026 වර්ෂයේ පැවැත්වීමට නියමිත T 20 ක්‍රිකට් ලෝක කුසලානයේ අවසන් පූර්ව වටයට පැමිණීම.

iii. 2026 වර්ෂයේ පැවැත්වීමට නියමිත දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ පදක්කම් සටහනේ පෙරමුණට පැමිණීම.

iv. 2026 වර්ෂයේ පැවැත්වීමට නියමිත යොවුන් ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ දී පදක්කම් ලබා ගැනීම.

v. 2028 වර්ෂයේ ඇමරිකාවේ පැවැත්වෙන ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා පරිසාධන මට්ටම අනුව සුදුසුකම් ලබා ගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් නියෝජනය කරවීම.

# ජාතික තරුණ සේවා සභාව

# ජාතික තරුණ සේවා සභාව

## 1. හැඳින්වීම

1979 දෙසැම්බර් මස 20 වන දින අංක 67/09 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් 1967 අංක 11 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා (සංශෝධිත) පනත අහෝසි කර, ප්‍රධාන තරුණ සංවර්ධන අරමුණු 14 ක් හඳුනාගෙන එමගින් ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ පූර්ණ වර්ධනය සහතික කිරීමට හැකිවන පරිදි ඔවුන්ගේ ස්වාර්ථයන් ප්‍රවර්ධනය කිරීම සඳහා 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනතද 1980 ජනවාරි මස 02 වන දින අංක 69/09 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් එම පනතේ 34 වන වගන්තිය යටතේ අදාළ රෙගුලාසි මාලාවද 1986 මාර්තු මස 10 වන දින අංක 392/05 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් තරුණ සේවා නියෝග ද ප්‍රකාශයට පත් කර ඇත.

මෙම පනත ප්‍රකාරව තරුණ සංවර්ධන අරමුණ 14 යටතේ දිවයිනේ සෑම තරුණයෙක් වෙතම තරුණ සංවර්ධන ප්‍රතිලාභ ළඟාකර දීම සඳහා මූලස්ථානය මහරගම නගරය කේන්ද්‍ර කරගනිමින් පළාත් මට්ටමින් කාර්යාල 09 ක් ද, දිස්ත්‍රික් කාර්යාල 26 ක් හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා ගොවිපල මධ්‍යස්ථාන 59 ක් ද දිවයින පුරා පිහිටුවා ඇත.

"තාරුණ්‍යයේ මහගෙදර" ලෙස මහජන විරුදාවලිය ලත් ජාතික තරුණ සේවා සභාව එම ඓතිහාසික ගමන් මග තුළ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ තරුණයාට ජයග්‍රහණ රාශියක් අත්පත් කර දී ඇත. ජාතික හා ජාත්‍යන්තරය ජයගත් කලාකරුවන්, ක්‍රීඩකයින්, සාහිත්‍යකරුවන්, ව්‍යවසායකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, දේශපාලනයකින්, ප්‍රජා නායකයන් බිහිකිරීමට අඩිතාලම ලබාදීමට ජාතික තරුණ සේවා සභාවට හැකියාව ලැබී ඇත.

කෙසේ නමුත්, තරුණ සංවර්ධන අරමුණු ගුරු කොට තබා ගනිමින්, කාලීනව සිදුවන වන සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික (කලාව), ක්‍රීඩා හා තාක්ෂණික ක්ෂේත්‍රයන් හී නව ප්‍රවනතා මත කාලීනව වෙනස් වන තරුණ අවශ්‍යතාවලට සංවේදී වෙමින් සකස් කර ඇති "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් තෘප්තිමත් තාරුණ්‍යයක්, නිවහල් චින්තනයක් වෙනුවෙන් තරුණ සංවර්ධන මූලධර්ම, ප්‍රවේශයන් හා ක්‍රියාමාර්ග ද සහස්‍ර සංවර්ධන හා ප්‍රමිතිගත ඉලක්ක, තිරසර සංවර්ධන අරමුණු (SDG Goals) සාක්ෂාත් කර ගැනීම පිළිබඳව ද අවධානය යොමුකරමින් 2025.09.30 දක්වා ඉටු කර ඇති කාර්යයන් හී ප්‍රගතිය මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කෙරේ.

## 2. දැක්ම

"බලසතු වූ ශ්‍රී ලාංකීය තරුණයෙක්"

## 3. මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර අවස්ථා උපයෝගී කොටගෙන ජීවිත අභියෝග සඳහා මුහුණ දීමට ශ්‍රී ලාංකීය තරුණයා සවිබල ගැන්වීම සඳහා පහසුකම් සැපයීම.

**4.** අරමුණු

i. ජාතික හැඟීම පිළිබඳ උද්යෝගයක්, විනය පිළිබඳ හැඟීමක්, සමාජ හා ආර්ථික ගැටළු පිළිබඳ අවබෝධයක් සහ ශ්‍රමාභිමානය පිළිබඳ හැඟීමක් තරුණයන් අතර පෝෂණය කිරීම.
ii. ජාතික සංවර්ධන යෝජනා ක්‍රමයන්හි තරුණයන්ගේ සහභාගිත්වය ඇති කර ගැනීම.
iii. ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල තරුණයන් අතර සුහදතාවය සහ අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම.
iv. තරුණයන් අතර තරඟකාරිත්වය හා ජයග්‍රහණය පිළිබඳ හැඟීම සඳහා දිරිගැන්වීම.
v. තරුණයන්ගේ දැනුම පුළුල් කිරීම සහ සංවර්ධනයට අදාළ ක්ෂේත්‍රයන්හි පුහුණුවීම ලබාදීම.
vi. තරුණයන් අතර සංස්කෘතික සාහිත්‍යමය හා කලාත්මක ක්‍රියාකාරකම් සඳහා දිරි ගැන්වීම
vii. තරුණයන් අතර ශාරීරික ප්‍රාගුන්‍යය හා ක්‍රීඩා වර්ධනය සඳහා දිරි ගැන්වීම.
viii. තරුණයන් සඳහා විනෝද කටයුතු සහ විනෝද සැපයුම් පිළිබඳ පහසුකම් සැලසීම.
ix. බාධිත තරුණයන්ට සහය වීම.
x. රජයේ ආර්ථික සැළසුම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, දීර්ඝ කාලීන ප්‍රතිපත්ති පදනමක් මත ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීමෙන් තරුණයන් සඳහා ක්‍රමික සේවා නියුක්තිය සඳහා අවස්ථාව සැලසීම.
xi. ප්‍රතිපත්ති සැකසීමේ හා ක්‍රියාත්මක කිරීමේ දී තරුණයන්ගේ සහභාගිත්වය සඳහා අවස්ථාව සැලසීම.
xii. තරුණ සංවිධාන පිහිටුවීම සහ තරුණ සුබ සාධනය සඳහා දැනටමත් පිහිටුවා ඇති සංවිධාන වලට සහය වීම.
xiii. තරුණ සේවා ව්‍යාප්තිය සැළසුම් කිරීම,ඒකාබද්ධ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මෙහෙයවීම.
xiv. එක් එක් තරුණයාගේ ආවේනික ලක්ෂණ වර්ධනය කිරීම.

**5.** ප්‍රධාන කාර්යයන්

**5.1.** **තරුණයින් ජාලගත කර සහ අනාගතයට ගැළපෙන පරපුරක් නිර්මාණය කිරීම**

**(අ) තරුණයින් තුළ සෞන්දර්යාත්මක කුසලතා වර්ධනය**

- සංගීත /නර්ථන ලලිත කලාවේදී ඩිප්ලෝමා පාඨමාලාව
- ජාතික යෞවන සම්මාන තරඟාවලිය හා උළෙල
- දිස්ත්‍රික් නාට්‍ය වැඩමුළු
- තරුණ නාට්‍ය උළෙල

**(ආ) තරුණයන්ගේ ක්‍රීඩා කුසලතා සංවර්ධනය**

- 35 වන ජාතික යෞවන ක්‍රීඩා තරඟාවලිය හා උළෙල
- ජාතික ක්‍රීඩා පුහුණු පාසල (හෙයියන්තුඩුව)

**(ඇ) තරුණ සංවිධාන පිහිටුවීම හා තරුණයන් ජාලගත කිරීම**

- ග්‍රාම නිලධාරී මට්ටමින් නව යෞවන සමාජ පිහිටුවීම පැරණි යෞවන සමාජ ප්‍රති සංවිධානය හා පිහිටුවීම.(ප්‍රාදේශීය, දිස්ත්‍රික්, ජාතික මණ්ඩලය)
- මත්ද්‍රව්‍ය නිවාරණ දැනුවත් කිරීමේ වැඩසටහන්
- නායකත්ව කුසලතා සංවර්ධන කඳවුරු හා වැඩමුළු
- තරුණ හුවමාරු වැඩසටහන්

## 5.2. තරුණයින් තුළ වෘත්තීය සහ රැකියා නිපුණතා සංවර්ධනය

**(අ) තරුණයින් තුළ රැකියා නිපුණතා ඇතිකිරීම**

නවීන තාක්ෂණික උපායමාර්ග ඔස්සේ යාවත්කාලීන වූ පුහුණු මධ්‍යස්ථාන මගින් වෙළෙඳපොළ ආකර්ශණය කල හැකි නිපුනතාවයන්ගෙන් යුත් තරුණ තරුණියන් බිහි කිරීම.

**(ආ) විභාග සහ ඇගයීම් කටයුතු**

- පුහුණු මධ්‍යස්ථාන මගින් වෘත්තීය පුහුණුව ලැබූ සිසුන්ගේ නිපුනතාවය ඇගයිම හා පිළිගත් සහතිකපත් නිකුත් කිරීම.

**(ඇ) වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය**

- තරුණ තරුණියන් සඳහා වෘත්තිය මාර්ගෝපදේශනය ලබා දීම.
- මනෝ විද්‍යාත්මක උපදේශනය

## 5.3. තරුණ ව්‍යවසායකයින් බිහිකිරීම.

**(අ) ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන**

- තරුණ ප්‍රජාව තුළ ව්‍යාපාරික අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම.
- තරුණ ප්‍රජාව කෘෂි කර්මාන්තය හා දේශීය වගාවන් සඳහා යොමු කිරීම.
- ආදර්ශමත් ගොවිපළවල් සංවර්ධනය තුළින් තාරුණ්‍ය යේ ආර්ජීකය සවිබල ගැන්වීම.නව ව්‍යාපාරික අවස්ථාවන් හඳුන්වා දිම.

**(ආ) තරුණ ගොවිපොල සංවර්ධනය**

- ගොවිපල පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම හා සංවර්ධනය කිරිම.
- ගොවිපල මධ්‍යස්ථාන ආශ්‍රිතව සංචාරක කෘෂිකර්මාන්ත ප්‍රවර්ධනය කිරිම.
- තරුණ කෘෂි සමාගම් පිහිටුවීම හා තරුණ කෘෂි ව්‍යවසායකයින් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.
- තරුණ කෘෂි ප්‍රදර්ශන පැවැත්වීම.

## 5.4. අභ්‍යන්තර ධාරිතා සංවර්ධනය

**(අ) පර්යේෂණ සිදුකිරීම, සැලසුම් හා ප්‍රගති සමාලෝචන**

- 2023 වාර්ෂික වාර්තාව හා කාර්ය සාධන වාර්තාව එළිදැක්වීම
- මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික වාර්ෂික ප්‍රගතිය අධීක්ෂණය

**(ආ) මානව ධාරිතා සංවර්ධනය**

- කාර්ය මණ්ඩලය වෙනුවෙන් ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දත්ත පද්ධතිය පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම (Face Book,Sri Lanka web)

**5.5. ආයතනික ඩිජිටල්කරණය (Digitalization of the Organization)**

**(අ) තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධනය**

- කළමනාකරණ තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම.

**ආ) මාධ්‍ය ප්‍රචාරය හා ප්‍රවර්ධනය**

- විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ප්‍රචාරක ප්‍රවර්ධන වැඩසටහන්

**5.6. ගෝලීය සන්දර්භය තුළ ශ්‍රී ලාංකීය තරුණයින් සවිබල ගැන්වීම**

(අ) ජාත්‍යන්තර තරුණ හුවමාරු වැඩසටහන් පැවැත්වීම.(දේශීය, විදේශීය මට්ටම)

(ආ) විදේශ පුහුණුවීම්, දේශන, වැඩමුළු

(ආ) එඩිම්බරෝ ආදි පාද යෞවන තිලිණ වැඩසටහන පැවැත්වීම

**5.7. ආයතනික සංවර්ධනය**

(අ) යටිතල පහසුකම් සංවර්ධනය

**6. මානව සම්පත් පැතිකඩ**

| | **අනුමත සේවක සංඛ්‍යාව** | **පවතින සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 72 | 42 | 30 |
| තෘතීයික | 128 | 56 | 72 |
| ද්විතීයික | 1126 | 850 | 276 |
| ප්‍රාථමික | 277 | 195 | 82 |
| **එකතුව** | **1558** | **1143** | **460** |

**7. 2025.09.30 දිනට ලඟාකරගත් ඉලක්ක**

i. යෞවන සමාජ 12628 ක් පිහිටුවීම
ii. යෞවන සමාජ ප්‍රාදේශීය මණ්ඩල 340 ක් පිහිටුවීම
iii. දිස්ත්‍රික් මණ්ඩල 26 ක් පිහිටුවීම
iv. ජාතික මණ්ඩලය පිහිටුවීම.
v. ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය ස්ථාපිත කිරීම.
vi. ජාතික තරුණ දිනය පැවැත්වීම
vii. නිර්මාණ කරුවන්ගේ දක්ෂතා එළිදැක්වීම
viii. ජාතික තරුණ සේවා සභාවේ ඇති පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හා පුහුණු මධ්‍යස්ථාන අළුත්වැඩියාව, නවීකරණය හා වැඩිදියුණු කිරීම.

**8. සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය (2025.09.30 දිනට)**

| අනු අංකය | ව්‍යාපෘතිය | වෙන් කල මුදල (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| 1 | මිහිකත සුරකීමේ තරුණ බලකාය (Clean Sri Lanka) | 2.00 | 2.00 | 1.29 | 64 | 100 |
| 3 | තරුණ දින සැමරීම (ජාතික/ ජාත්‍යන්තර) | 39.00 | 39.00 | 29.76 | 76 | 100 |
| 4 | දේශීය තරුණ හුවමාරු වැඩසටහන (අන්තර් සංස්කෘතික සංහිඳියාව සඳහා නැගම් යාම) | 13.60 | 13.60 | 0.65 | 5 | 23 |
| 5 | Youth Clubs පිහිටුවීම - Connect 2025- | 11.00 | 11.00 | 7.50 | 68 | 100 |
| 6 | තරුණ නායකත්ව පුහුණු කඳවුරු | 10.00 | 10.00 | 0.00 | 0.00 | - |
| 7 | බහුකාර්ය සේවා මධ්‍යස්ථාන (MMC) | 0.00 | 0.00 | 0.00 | - | 10 |
| 8 | පාඨමාලා අවසන් පරීක්ෂණ පැවැත්වීම | 13.40 | 13.40 | 10.02 | 75 | 56 |
| 9 | සහතික පත්‍ර ප්‍රදානය | 0.70 | 0.70 | 0.64 | 92 | 49 |
| 10 | රැකියා අභිමුඛ පාඨමාලා පැවැත්වීම | 20.00 | 20.00 | 14.78 | 74 | 90 |
| 11 | HAWASATA ITE | 8.00 | 8.00 | 0.00 | 0.00 | - |
| 12 | වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය | 3.40 | 3.40 | 0.60 | 18 | 35 |
| 13 | ක්‍රීඩා පුහුණු පාසල - හෙයියන්තුඩුව | 10.00 | 10.00 | 5.80 | 58 | 58 |
| 14 | 35 වන ජාතික යෞවන ක්‍රීඩා උළෙල | 180.00 | 180.00 | 14.90 | 8 | 23 |
| 15 | යෞවන සම්මාන තරඟාවලිය හා උළෙල 2024 | 10.00 | 10.00 | 9.79 | 98 | 100 |
| 16 | තරුණ ජාතික නාට්‍යය උළෙල | 14.00 | 14.00 | 0.00 | 0.00 | 30 |
| 17 | සෞන්දර්ය කුසලතා සංවර්ධන වැඩසටහන (ලළිත කලාවේදි) | 11.80 | 11.80 | 7.51 | 64 | 70 |
| 18 | දිස්ත්‍රික් නාට්‍ය පුහුණු වැඩමුළු | 7.50 | 7.50 | 1.59 | 21 | 78 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 19 | නිර්මාණ කරුවන්ගේ දක්ෂතා එළිදැක්වීම | 1.10 | 1.10 | 1.07 | 98 | 100 |
| 20 | තරුණ සේවා සංගීත හා නර්තන කණ්ඩායම | 29.00 | 29.00 | 17.24 | 59 | 90 |
| 21 | තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 9.00 | 9.00 | 0.12 | 1 | 7 |
| 22 | තරුණ ගොවිපල සංවර්ධනය | 6.00 | 6.00 | 1.72 | 26 | 65 |
| 23 | තරුණ සේවා සභාව ඩිජිටල්කරණය කිරීම (Youth App V4R) | 2.00 | 2.00 | 0.09 | 5 | 30 |
| 24 | ඩිජිටල් උපකරණ නඩත්තුව | 8.00 | 8.00 | 0.06 | 1 | 25 |
| 25 | පර්යේෂණ සැලසුම් ව්‍යාපෘති අධීක්ෂණය හා නියාමනය | 2.00 | 2.00 | 1.09 | 54 | 70 |
| 26 | ධාරිතා සංවර්ධනය හා කාර්ය මණ්ඩල ඇගයීම් | 7.50 | 7.50 | 1.11 | 15 | 100 |
| 27 | මාධ්‍ය ප්‍රචාරණය | 2.85 | 2.85 | 0.94 | 33 | 76 |
| | රූපවාහිනී නිෂ්පාදනය හා සංස්කරණය, ප්‍රවෘත්ති ආවරණය | 1.50 | 1.50 | 1.02 | 68 | 70 |
| | තරුණ සිනමා උළෙල | 8.00 | 8.00 | 0.00 | - | - |
| 28 | තරුණ සේවා සභාව සන්නාමකරණය | 4.00 | 4.00 | 4.00 | 100 | 50 |
| 31 | ජාත්‍යන්තර වැඩසටහන් සඳහා තරුණ තරුණියන් සම්බන්ධ කිරීම | 15.00 | 15.00 | 10.01 | 67 | 78 |
| 32 | ජත්‍යන්තර ස්වේච්ඡා සේවක වැඩසටහන | 2.00 | 2.00 | 1.65 | 83 | 100 |
| 33 | ජාත්‍යන්තර යෞවන තිළිණ ප්‍රදාන වැඩසටහන | 4.00 | 4.00 | 1.88 | 47 | 60 |
| 34 | තරුණ සේවා සභා ප්‍රධාන ශාලාව අළුත්වැඩියා කිරීම | 13.60 | 13.60 | 13.60 | 100 | 10 |
| 35 | බෙල්වුඩ් මධ්‍යස්ථානයේ වැඩ අවසන් කිරීම | 10.00 | 10.00 | 1.64 | 16 | 60 |
| 36 | ජාතික තරුණ සේවා සභාවේ ඇති පලාත් කාර්යාල දිස්ත්‍රික් කාර්යාල හා පුහුණු මධ්‍ය ස්ථාන අළුත්වැඩියාව නවීකරණය හා වැඩිදියුණු කිරීම | 59.00 | 59.00 | 1.59 | 3 | 45 |
| 37 | යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම | 5.00 | 5.00 | 0.32 | 7 | 5 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 38 | කාර්යාලයීය උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 56.05 | 56.05 | 8.78 | 16 | 60 |
| | **එකතුව** | **600.00** | **600.00** | **172.76** | | |

**9. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය 2025.09.30 දිනට**

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මි.) | 2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | **(රු.මි.)** | **(%)** |
| පුනරාවර්තන වියදම | 1665.00 | 1665.00 | 1079.68 | 65 |
| ප්‍රාග්ධන වියදම | 600.00 | 600.00 | 172.76 | 29 |
| **එකතුව** | **2265.00** | **2265.00** | **1252.44** | |

**10. 2026-2029 ඉදිරි ඉලක්ක**

i. තරුණ සේවා සභාව ඩිජිටල්කරණය කිරීම. (Youth App V4R)
ii. බහුකාර්ය සේවා මධ්‍යස්ථාන (MMC) ආරම්භ කිරීම.
iii. දේශීය හා විදේශීය වෙළෙඳපොළ සඳහා අවශ්‍ය පරිදි පාඨමාලා වෙනස් කිරීම.
iv. පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
v. විදේශ රැකියා අවස්ථා මත ජාත්‍යන්තර භාෂා පාඨමාලා වැඩි කිරීම.
vi. දැනුම හා පහසුකම් ලබාදී තරුණ ව්‍යවසායකයින් බිහි කිරීම.
vii. කෘෂිකාර්මික ආර්ථිකයකට සහ කෘෂි ව්‍යවසායකත්වයකට තරුණයන් යොමු කිරීම.
viii. දේශීය හා විදේශීය තරුණ සංවිධාන සමඟ සහයෝගිතාව වර්ධනය කිරීම.
ix. තීරණ ගැනීමේ ක්‍රියාවලියට තරුණ සහභාගීත්වය සඳහා අවස්ථා ලබා දීම.
x. ආයතනය තුළ ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා ඵලදායිතා ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධ වී ඉදිරි වැඩකටයුතු සිදු කිරීම.
xi. තරුණ - ප්‍රජා සංවර්ධන වැඩසටහන ආරම්භ කිරීම.

# ජාතික යොවුන් සේනාංකය

## ජාතික යොවුන් සේනාංකය

### 1. හැඳින්වීම

රටක තරුණයා ඉතා වැදගත් සමාජ සාධකයක් වන අතර, රටක ආර්ථික වර්ධනය මෙන්ම ජාතික ආරක්ෂාව ද විශාල පරිමාවකින් තරුණයින් මත රඳා පවතී. තරුණ පරපුර ගුණාත්මක බවින් පිරිපුන් කුසලතා පූර්ණ ප්‍රජා කණ්ඩායමක් ලෙස ගොඩනැංවීම ඕනෑම රටක ප්‍රධානතම අවශ්‍යතාවයක් ලෙස සැලකේ. මෙහිදී වඩාත් වැදගත් වන්නේ තරුණයා තුළ ජීවන කුසලතා ස්ථාපිත කිරීමයි. ජීවන කුසලතා තමා තුළ ස්ථාපිත නොවූ කිසිවකු වඩා යහපත් සමාජයක ජීවත්වීමට ඉඩ සලසන, සාරය තේරුම් ගැනීමට උත්සාහ කිරීම පිළිබඳ ආකල්පයන් නොදරයි. මේ වන විට ශ්‍රම වෙළෙඳපොළෙහි නව රැකියා අපේක්ෂිකයින් තුළ දෘඪ කුසලතා පිළිබඳ නිපුණතාවයන් හා සමගාමීව ජීවන කුසලතා අපේක්ෂා කරයි. ශ්‍රී ලාංකික තරුණ තරුණියන් තුළ ජීවන කුසලතා ස්ථාපිත කිරීමේ පුහුණු වැඩසටහනක අවශ්‍යතාවය වර්තමානය වන විට අන් කවරදාකටත් වඩා ඉතා බැරෑරුම් ලෙස පැන නැඟී ඇත. මේ අනුව, 2002 අංක 21 දරන පාර්ලිමේන්තු පනත මඟින් යොවුන් සංවර්ධනය, රැකියා පුහුණුව සහ වෘත්තීමය අධ්‍යාපනය සඳහා ස්ථාපිත ජාතික යොවුන් සේනාංකය විනය, නායකත්වය සහ පෞරුෂය යන ප්‍රධාන පුහුණු සංරචක පාදක කර ගනිමින් දැයේ තාරුණ්‍ය ජීවන කුසලතා මඟින් සවිබල ගැන්වීමේ කාර්යයේ නියැලී ඇත.

වර්තමානයේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික යොවුන් සේනාංකය දිවයිනේ තරුණ සංවර්ධනය සඳහා "ජීවන කුසලතා (Life Skills)" සංවර්ධන පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබන එකම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කරමින් සිටී. පවතින අධ්‍යාපන ක්‍රමයේ තරගකාරී ස්වභාවය සමඟ බද්ධ වන අනෙකුත් සමාජ සංසිද්ධීන් තරුණයා තුළ ජීවන කුසලතා ගොඩනැංවීම අධෛර්යමත් කර ඇත. එබැවින් තරුණයාගේ සමෘද්ධිමත් අනාගතය සඳහා වූ අභිලාෂයන් අනාගත වැඩලෝකය සහ ඊට ගැලපෙන ලෙස ජීවන කුසලතා තරුණයා වෙත සම්ප්‍රේෂණය කිරීම ජාතික යොවුන් සේනාංකයේ මූලික කාර්යයභාරය ලෙස හඳුනාගෙන ඇත.

විශේෂයෙන්, "Gen. Z" පරම්පරාව පොදු අවකාශය තුළ සක්‍රීයව කටයුතු කරන නුමුත්, නිසි ආකාරයෙන් රටක සංවර්ධනය උදෙසා යොදා ගැනීමට ඉලක්කගත කිරීමක් හෝ නිසි නායකත්වයකින් මඟ පෙන්වාදීමක් නොමැතිව කටයුතු කරන බව නිරීක්ෂණය වන බරපතල කාරණයකි. ඔවුන් පොදු අවකාශයෙන් පරිභාහිරව සමාජයක් වශයෙන් ගත්විට එකිනෙකාගෙන් ව්‍යුක්තව තනි පුද්ගලයෙක් වශයෙන් කටයුතු කිරීමට උත්සුක වී ඇත. නමුත්, රටක සමාජයක සංවර්ධනය යනු තනි පුද්ගල ප්‍රතිමාන ලෙස ගොඩනැගීම හෝ ක්‍රියාකිරීම නොව ඔවුන් සමාජයක් තුළ අනෙකා සමඟ එක්ව ගෝලීයකරණය වූ සමාජය තුළ **"විශ්වීය මිනිසෙක්"** වශයෙන් කටයුතු කිරීමයි.

වර්තමානය වන විට දැවැන්ත වෙනස්කම් හා අභියෝගයන්ට මුහුණ දී ඇති ලෝකය තුළ තරුණ පරපුර සමාජයේ මූලික ස්ථානයක සිටී. ඔවුන් හට සමාජය වෙනස් කිරීමට හා තිරසාර සංවර්ධනයක් ලබා දීම සඳහා සක්‍රීය භූමිකාවක් ඇත. මේ නිසා, තරුණයන්ට අවධානය යොමු කිරීමත්, ඔවුන්ගේ ගැටලු හා අවශ්‍යතා දැන ගැනීමත් ඉතා වැදගත් වේ. ඒ අනුව, ලෝකයේ අනාගත ගාමක බලවේගය බවට පත්වීමට සිටින මෙම පරම්පරාවේ තාරුණ්‍යයට නිසි මඟ පෙන්වීම සහ **විනයවත් ප්‍රගතිගාමී තරුණයෙකු රටේ අනාගතයට ලබාදීම සඳහා බලගැන්වූ** රාජ්‍ය යාන්ත්‍රණයක් ලෙස ජාතික යොවුන් සේනාංකය කටයුතු කරමින් ඇත. මෙම කර්තව්‍ය සඳහාම සකසන ලද ජීවන කුසලතා ත්‍රයිමාසික පාඨමාලාව පෙන්වා දිය හැකිය. 2026 වර්ෂයේ සිට මෙම පාඨමාලාව නව්‍ය විෂය මාර්ගෝපදේශ ඔස්සේ ක්‍රියාත්මක වන නේවාසික පුහුණු පාඨමාලාවක් ලෙස ක්‍රියාත්මක කිරීමට ද මේ වන විට කටයුතු යොදා ඇත.

**2. දැක්ම**

"ගෝලීය සමාජයට ගැලපෙන, අභිමානවත්, සමබර ශ්‍රී ලාංකීය තාරුණ්‍යයක්"

**3. මෙහෙවර**

නව්‍ය සංස්කෘතියක් උදෙසා සමාජ සංවර්ධනයට දායක වෙමින් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමුඛතම සේවා සම්පාදන ආයතනය ලෙස ජීවන නිපුණතා ප්‍රශස්තව හා තිරසරව අත්කර දෙමින් ඉලක්ක ප්‍රජාව බලගන්වමින් ජාතික සංවර්ධනයට දායක වීම.

**4. අරමුණු**

2024 – 2028 උපාය මාර්ගික සැලැස්මට අනුව හඳුනාගෙන ඇති අභිමතාර්ථ සහ අරමුණු පහත පරිදි වේ.

| | **අභිමතාර්ථ** | | **අරමුණු** |
|---|---|---|---|
| 1. | ප්‍රශස්ථ නිපුණතාවයන්ගෙන් යුත් ස්වාභිමාණී තාරුණ්‍යයක් | 1. | 2027 වනවිට රැකියා වෙළඳපොළ ප්‍රවනතාවයන්ට ගැලපෙන නිපුණතාවයන්ගෙන් යුත් පුහුණු ශ්‍රමිකයින් 113,520 ක් දේශීය හා විදේශීය වශයෙන් රැකියාගත වීම. |
| | | 2. | 2027 වන විට 265,000 ක් වූ ඉලක්කගත තරුණ ප්‍රජාව අනාගත වැඩලෝකයට ගැලපෙන ජීවන කුසලතාවලින් යුක්ත වීම. |
| | | 3. | 2025 වනවිට කළමනාකරණ දත්ත පද්ධතියක් (MIS) හා ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS) ස්ථාපිත වීම. |

| | | | |
|---|---|---|---|
| 2. | බලගැන්වූ සමාජයක් තුළ ඉහළ පිළිගැනීමක් සහිත ආයතනයක් | 4. | 2027 වනවිට සමාජ, ආර්ථික, සංස්කෘතික හා පාරිසරික වශයෙන් බලගැන්වූ ආයතන 60 ක් වූ පුහුණු මධ්‍යස්ථාන පද්ධතියක්. |
| | | 5. | 2027 වනවිට ආකර්ශනීය පුහුණු මධ්‍යස්ථාන ජාලයක් ස්ථාපිත වීම. |
| | | 6. | 2027 දී 25% ක ස්වයං මූල්‍යයන ආයතනයක්. |
| 3. | ඉහළ සදුසුකම් සහිත සන්නාමගත ජාත්‍යන්තරව පිළිගත් සේවා බෙදාහැරීමේ ආයතනයක් | 7. | 2025 දී සන්නාමගත සහතිකකරණයකින් යුත් ආයතනික පද්ධතියක්. |
| | | 8. | 2025 වනවිට අන්තර්ජාතිකව තහවුරු කරන ලද තත්ත්ව කළමනාකරණ පද්ධති සහිත ආයතනයක්. |
| | | 9. | 2027 වනවිට ඉලක්කගත ප්‍රතිලාභීන් අන්තර්ජාතික ශ්‍රම වෙළඳපොල ඉල්ලුමට ගැලපෙන සුදුසුකම් ලත් පුහුණුලාභීන් බවට පත්වීම. |

**5. ප්‍රධාන කාර්යයන්**

2024 – 2028 උපාය මාර්ගික සැලැස්මට අනුව හඳුනාගෙන ඇති ප්‍රමුඛ කාර්යයන් පහත පරිදි වේ.




**5.1. ජාතික යොවුන් සේනාංකය මඟින් මෙහෙයවනු ලබන පාඨමාලා සහ වැඩසටහන්**

**5.1.1 ජීවන කුසලතා පාඨමාලාව : මූලික පාඨමාලාවේ ස්වභාවය**

- අභ්‍යන්තර (මාස 3ක පුහුණු පාඨමාලාවක්)
- බාහිර පාර්ශවයන් (දින 14 ක ජීවන කුසලතා පුහුණු වැඩසටහන)
    - රාජ්‍ය සහ පෞද්ගලික අංශය

- අභිරුචිකරණය කළ පාඨමාලා

### 5.1.2 අභ්‍යන්තර පුහුණුලාභීන් සඳහා ලැබෙන ප්‍රතිලාභ

- ජීවන කුසලතා සහතිකය.
- ධීර අභ්‍යාස පුහුණු සහතිකය.
- සහභාගී වනු ලබන වැඩසටහන් සහ දක්වන දක්ෂතාවයන් අනුව තවත් සහතික (ක්‍රීඩා, කලා, ධීර අභ්‍යාස පුහුණු සහතිකය සහ වෙනත්).
- නිළ ඇඳුම්.
- පුහුණු කාලසීමාව තුළ පැය 24ම ආවරණය වන පරිදි රු. 500,000.00 ක ජීවිත රක්ෂණාවරණයක්.
- පුහුණු කාලසීමාව අවසානයේ රු. 100,000 ක වටිනාකමකින් යුතු වෘත්තීය පුහුණුවක්.

### 5.1.3 වෘත්තිය අභිමුඛ පාඨමාලා

නිපුන වෘත්තීයවේදීන් බිහිකිරීම අරමුණු කර දෙස් විදෙස් රැකියා වෙළඳපොල ඉලක්ක කරගනිමින් ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයක අධීක්ෂණය යටතේ ජාතික යොවුන් සේනාංක දඹුල්ල හෝටල් පුහුණු පාසල, දිගම්පතන - දඹුල්ල හෝටල් පුහුණු පාසල සහ කතරගම හෝටල් පුහුණු පාසල පාඨමාලා රැසකින් ක්‍රියාත්මක වෙමින් පවතී. තවද, ජාතික යොවුන් සේනාංක යක්කල සෞන්දර්ය පුහුණු පාසල ද තරුණ වෘත්තීයවේදීන් බිහිකිරීම උදෙසා පාඨමාලා ක්‍රියාත්මක කර ඇත.

- දඹුල්ල හෝටල් පුහුණු පාසල -
  Front Office (NVQ IV), Pastry & Bakery (NVQ IV), Food & Beverage (NVQ IV), International Cookery (NVQ IV), Housekeeping (NVQ III), Assistant Bungalow Keeper (NVQ III), Room Attendant (NVQ III).

- කතරගම හෝටල් පුහුණු පාසල - Housekeeping (NVQ III)

- විශේෂ සංගීත(NVQ IV) හා නර්ථන (higher Diploma – NVQ VI) පාඨමාලා - යක්කල සෞන්දර්යය නිකේතනය

### 5.1.4. ධීර අභ්‍යාස පුහුණු ආයතනය - නාඋල

ධීර අභ්‍යාස පුහුණුව යොවුන් සේනාංක මූලික පුහුණු පාඨමාලාවේ අනිවාර්යය අංගයක් වන අතර මෙමඟින් පුද්ගලයින් තුළ විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ ජීවන කුසලතා (Life Skills) වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

නිරීක්ෂණය, පුද්ගලයින් හඳුනාගැනීම, නිර්මාණශීලී චින්තනය, ආත්ම විශ්වාසය, ස්වයං විනය, ධීර අභ්‍යාස, කළමනාකරණ අභ්‍යාස, රස වින්දනය, විශ්වාසය, නායකත්ව දැරීම, වගකීම හා වගවීම, පරිසර සංරක්ෂණය සහ මත්ද්‍රව්‍ය නිවාරණය යන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඊට අදාළ කුසලතා වර්ධනය කිරීම මෙහිදී සිදුකරනු ලබයි.

**6.** මානව සම්පත් පැතිකඩ

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 18 | 13 | 5 |
| තෘතියික | 127 | 61 | 66 |
| ද්විතියික | 716 | 491 | 225 |
| ප්‍රාථමික | 89 | 72 | 17 |
| **එකතුව** | **950** | **637** | **313** |

**7. 2025.09.30 දිනට ළඟා කරගත් ඉලක්ක**

I. 2025 වනවිට කළමනාකරණ දත්ත පද්ධතියක් (MIS) ස්ථාපිත කිරීම.
II. ජීවන කුසලතා විෂය නිර්දේශය යාවත්කාලීන කිරීම.

**8. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය (2025.09.30 දිනට)**

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන්කල මුදල (රු.මිලි) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මිලි) | 2025.09.30 දිනට | | |
|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
| 1 | බහු විධ මධ්‍යස්ථාන (MMC). | 100.00 | 100.00 | 0 | 0 | 0 |
| 2 | කතරගම හෝටල් පුහුණු පාසල- Type- C ගොඩනැගිල්ල ඉදිකිරීම. | 72.00 | 50.00 | 10.02 | 20.04 | 55 |
| 3 | නුවරඑළිය පුහුණු මධ්‍යස්ථානය- මුළුතැන්ගෙය, පරිගණක විද්‍යාගාරය හා නේවසිකාගාර ගොඩනැගිල්ල ඉතිරි වැඩ නිම කිරීම. | 50.00 | 20.00 | 5.40 | 12 | 40 |
| 4 | වැල්ලවාය පුහුණු මධ්‍යස්ථානය- ශ්‍රවනාගාර ගොඩනැගිල්ල ඉතිරි වැඩ නිම කිරීම. | - | 26.46 | 0.00 | 0 | 20 |
| 5 | දිගම්පතන පුහුණු මධ්‍යස්ථාන වැට, මුරකුටිය ඉදිකිරීම,ප්‍රවේශ වන මාර්ගය හා කාණු පද්ධතිය ඉදිකිරීම. | - | 21.00 | 0.00 | 0 | 20 |
| 6 | කතරගම පුහුණු මධ්‍යස්ථානය-කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම. | - | 25.00 | 0.00 | 0 | 20 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | නාඋල පුහුණු මධ්‍යස්ථානය- ප්‍රධාන ගොඩනැගිල්ල හා භෝජනාගාරයේ ඉතිරි වැඩ නිමකිරීම. | - | 8.00 | 0.00 | 0 | 20 |
| 8 | යක්කල පුහුණු මධ්‍යස්ථානය- කාන්තා නේවාසිකාගාරයේ ඉතිරි වැඩ නිමකිරීම. | - | 7.00 | 0.00 | 0 | 20 |
| 9 | මහියංගනය පුහුණු මධ්‍යස්ථානය- මාර්ගය සකස් කිරීම. | - | 5.00 | 0.00 | 0 | 20 |
| 10 | මාදම්පේ පුහුණු මධ්‍යස්ථානය-Type B ගොඩනැගිල්ල ඉතිරි වැඩ නිමකිරීම. | 5.67 | 0.00 | 0.00 | 0 | 20 |
| 11 | දිගම්පතන පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම. | 14.60 | 0.00 | 0.00 | 0 | 20 |
| | | | | | | |
| 12 | දිගම්පතන පුහුණු මධ්‍යස්ථානය - **අවසන් බිල්පත් ගෙවීම.** | 13.55 | 11.00 | 4.24 | 39 | 100 |
| 13 | මාදම්පේ පුහුණු මධ්‍යස්ථානය - **අවසන් බිල්පත් ගෙවීම.** | 33.99 | 26.00 | 19.89 | 77 | 100 |
| 14 | නාඋල පුහුණු මධ්‍යස්ථානය - **අවසන් බිල්පත් ගෙවීම.** | 9.68 | 3.50 | 0.00 | 0 | 100 |
| 15 | කතරගම පුහුණු මධ්‍යස්ථානය - **අවසන් බිල්පත් ගෙවීම.** | 22.37 | 17.00 | 15.45 | 91 | 100 |
| 16 | සූරියවැව පුහුණු මධ්‍යස්ථානය -**අවසන් බිල්පත් ගෙවීම.** | 0.60 | 2.50 | 0.58 | 23 | 100 |
| | | **322.46** | **322.46** | **55.58** | | |

**9. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 2025.09.30 දිනට**

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මි.) | 2025.09.30 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | (රු.මි.) | (%) |
| පුනරාවර්තන වියදම | 500.00 | | 54.89 | 11 |
| ප්‍රාග්ධන වියදම | 1135.00 | | 754.35 | 66.46 |
| එකතුව | **1635.00** | | **809.24** | **49.49** |

## 10. 2025 වර්ෂය තුළ ලබාගත් විශේෂ ජයග්‍රහණ (ඡායාරූප ද සමඟ)

10.1 දකුණු ආසියානු ප්‍රවීණයන්ගේ මළල ක්‍රීඩා උළෙල 2025 - මංගල ක්‍රීඩාංගනය, ඉන්දියාවේ බැංගලෝර් හිදී 2025.01.11, 12 සහ 13 යන දිනයන්හිදී පැවැත්විය. එහිදී, ජාතික යොවුන් සේනාංක යක්කල පුහුණු මධ්‍යස්ථානයේ සරඹ උපදේශිකා ඒ. ජී. ආර්. සමන්ති ගොඩෙවිතාරණ මහත්මිය විසින් තරඟ ඉසව් 03ක් ජයග්‍රහණය කරමින් දේශයට, ජාතියට සහ ආයතනයට විශාල කීර්තියක් අත්කර දෙන ලදී.

I. ජයග්‍රහණය කරන ලද තරඟ ඉසව්: - 200m, 100m × 4, 200m × 4

II. ජයග්‍රහණ:

- රන් පදක්කම් - 02
- ලෝකඩ පදක්කම් - 01








10.2 ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සංවිධානය කළ සූප ශාස්ත්‍ර කලා තරඟාවලිය 2025 සඳහා දඹුල්ල ජාතික යොවුන් සේනාංක හෝටල් පුහුණු පාසලේ පුහුණුලාභීන් සහභාගී වූ අතර, එහිදී පුහුණුලාභීන් දෙදෙනෙකු ලෝකඩ පදක්කම් දිනා ගැනීමට සමත් විය.

ජයග්‍රහණ: -

| අනු අංකය | තරඟ අංශය | පුහුණුලාභියාගේ නම |
|---|---|---|
| 01 | Innovative Mock tail (Professional) | ඩී. ජී. ජේ. චාමික |
| 02 | Plated Main Course Oriental (Professional) | බී. ඩබ්. සී. සෙනෙත් |









**11. 2026-2029 ඉදිරි ඉලක්ක**

I. 2027 වන විට රැකියා වෙළඳපොළ ප්‍රවනතාවයන්ට ගැලපෙන නිපුණතාවයන්ගෙන් යුත් පුහුණු ශ්‍රමිකයින් 113,520 ක් දේශීය හා විදේශීය වශයෙන් රැකියාගත කිරීම.

II. 2027 වන විට 265,000 ක් වූ ඉලක්කගත තරුණ ප්‍රජාව අනාගත වැඩලෝකයට ගැලපෙන ජීවන කුසලතාවලින් යුක්ත කිරීම.

III. 2027 වන විට සමාජ, ආර්ථික, සංස්කෘතික හා පාරිසරික වශයෙන් බලගැන්වූ ආයතන 60 ක් වූ පුහුණු මධ්‍යස්ථාන පද්ධතියක් ස්ථාපිත කිරීම.

IV. 2027 වන විට ආකර්ශනීය පුහුණු මධ්‍යස්ථාන ජාලයක් ස්ථාපිත කිරීම.

V. 2027 දී 25% ක ස්වයං මූල්‍යායන ආයතනයක්.

VI. සන්නාමගත සහතිකකරණයකින් යුත් ආයතනික පද්ධතියක්.

VII. අන්තර්ජාතිකව තහවුරු කරන ලද තත්ත්ව කළමනාකරණ පද්ධති සහිත ආයතනයක්.

VIII. 2027 වන විට ඉලක්කගත ප්‍රතිලාභීන් අන්තර්ජාතික ශ්‍රම වෙළඳපොල ඉල්ලුමට ගැලපෙන සුදුසුකම් ලත් පුහුණුලාභීන් බවට පත්වීම.

IX. 2026 වර්ෂයේ සිට ජීවන කුසලතා පාඨමාලාව නේවාසික පුහුණු පාඨමාලවක් වශයෙන් ක්‍රියාත්මක කිරීම.

# නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය

## නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය

### 1. හැඳින්වීම

දිවංගත ජනාධිපති ගරු ආර්.ප්‍රේමදාස මැතිතුමාගේ සංකල්පයක් අනුව 1985 වර්ෂයේ ඇඹිලිපිටිය නගරය කේන්ද්‍ර කර ගනිමින් පවත්වන ලද ගම්උදාව වැඩසටහනේ ප්‍රදර්ශන භූමිය ලෙස පැවති අක්කර 35ක පමණ භූමි භාගය තුළ "ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය" නමින් 1985 වර්ෂයේ ඔක්තෝබර් 03 දින ස්ථාපිත කර ඇත. වර්ථමානයේ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ පවත්නා මෙම මධ්‍යස්ථානය 2013 වර්ෂයෙන් පසු, ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ ප්‍රධාන කාර්යයෙන් ඔබ්බට ගොස් පුහුණු වැඩසටහන් පැවැත්වීම හේතුවෙන් "නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය" නමින් කැබිනට් පත්‍රිකාවක් මගින් නාමය වෙනස් කර ඇත.

වර්තමානය වන විට මෙම මධ්‍යස්ථානය එකවර 400 පමණ පුහුණුලාභීන් සංඛ්‍යාවකට නේවාසික පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාර (වායු සමනය කරන ලද කාමර 11 ක් ඇතුළත්ව) 13 ක්, 400 කට එකවර අසුන් ගත හැකි වායු සමනය කරන ලද සම්මන්ත්‍රණ ශාලාවක්, තවත් දේශන ශාලා 04 ක් සහ එකවර 150 කට ආහාර ගත හැකි අංගසම්පූර්ණ භෝජනාගාරයකින්, නිල නිවාස 16 ක් හා ප්‍රධාන කාර්යාලය ඇතුලු ගොඩනැගිලි 47 කින් සහ මනරම් නිදහස් භූමි භාගයකින් යුක්ත වේ. එමෙන්ම පුහුණු වැඩසටහන් සඳහා භාවිතා කරන වික්‍රමාන්විත ක්‍රියාකාරකම් (Adventure Based Training) ආශ්‍රිත පුහුණු පිටියක්ද මධ්‍යස්ථානය සතුව පවතී.

වර්තමානයේ මෙම මධ්‍යස්ථානය මඟින් පාසල් ශිෂ්‍ය නායකයින්, යෞවන සමාජ ඇතුළු තරුණ ප්‍රජාව, රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රජා මූල සංවිධාන ක්‍රියාකාරීන් සඳහා පුහුණු වැඩසටහන් ප්‍රමුඛ කොටගත් වැඩසටහන් සහ විෂය මූලික වැඩසටහන් ඇතුළු පුහුණු වැඩසටහන් පවත්වාගෙන යන අතර 2023 වර්ෂය අවසානයේ සිට සම්පූර්ණයෙන් නොමිලේ පාඨමාලා පැවැත්වීම වෙනුවට ගාස්තු අයකිරීම හඳුන්වා දෙන ලදි. තවද බාහිර ආයතනවල පුහුණු වැඩසටහන් සඳහා ආහාරපාන, නවාතැන් සහ දේශනශාලා පහසුකම් සැපයීම හා පුහුණු වැඩසටහන් ලබාදීම තුලින් ආයතනය වාර්ෂිකව විශාල මුදලක් උපයනු ලැබේ.

### 2. දැක්ම

" නායකත්ව කුසලතාවයන්ගෙන් හෙබි යෞවන ප්‍රජාවක්"

### 3. මෙහෙවර

ඵලදායි පුහුණු හා පර්යේෂණ තුළින් යෞවන ප්‍රජාවගේ නායකත්ව කුසලතා සංවර්ධනය කිරීම

**4. අරමුණු**

i. පාසල් සිසුන් හා යෞවන ප්‍රජාවගේ නායකත්ව හා පෞරුෂත්ව සංවර්ධනය කිරීම
ii. වෘත්තීය ක්ෂේත්‍රයන් තුළ සාර්ථකත්වයට අධ්‍යාත්මික ප්‍රාග්ධනයෙන් යුතු ප්‍රජාවක් බිහි කිරීම
iii. රටේ සංවර්ධනයට දායකවීම පිණිස නිර්මාණශීලී, අන්‍යෝන්‍ය අවබෝධයක් සහිත, සංවාදශීලී, සඵලදායී තීරණ ගත හැකි ප්‍රජාවක් බිහි කිරීම.
iv. ප්‍රජා නායකත්වය පිණිස තරුණ පරපුර මෙහෙය වීම.
v. ජාතික පුහුණු අවශ්‍යතා සපුරාලන පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීම.

**5. ප්‍රධාන කාර්යයන්**

ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම වන අතර මෙම කටයුතු පහසුකරණය සඳහා ආයතන, සංවර්ධන, ගිණුම්, පුහුණු හා නඩත්තු අංශ ලෙස බෙදා වෙන්කොට ඇත. එක් එක් අංශයන්හි කාර්යභාරයන් පහත පරිදි වේ.

**i. ආයතන අංශය**

- දෛනික පරිපාලන කටයුතු
- උසස්වීම්, විනය පාලනය, කාර්ය සාධනය හා විශ්‍රාම ගැන්වීමට අදාල කටයුතු.
- පුහුණු නිලධාරීන් සහ සමස්ථ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම
- ආයතනය සතු වාහන නඩත්තුව හා ඊට අදාළ කටයුතු
- ලේඛනාගාර නඩත්තු කටයුතු

**ii. ගිණුම් අංශය**

- මූල්‍ය ඇස්තමේන්තු සැකසීම , වියදම් වාර්තා කිරීම හා අධීක්ෂණය
- ප්‍රසම්පාදන කටයුතු
- වත්කම් පාලනය
- විගණනය සඳහා තොරතුරු සැපයීම.
- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සීමාවත් ඉක්මවන අවස්ථාවන්හිදී ඊට අදාල කාර්යයන් සිදු කිරීම.

**iii. පුහුණු අංශය**

- පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ඒ ඒ පුහුණුලාභීන් හට සුදුසු වන පරිදි පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම
- පුහුණු සැසි සැලසුම් සකස් කිරීම
- පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකත්වය සැපයීම
- පාසල් සිසුන් සඳහා වන පුහුණු වැඩසටහන් පසු ඇගයීම් කටයුතු
- පුහුණු වැඩසටහන් ඇගයීම් සාරාංශකරණය හා සුදුසු පරිදි පුහුණු කටයුතු විවිධාංගීකරණය කිරීම
- පුහුණු උපකරණ නිර්මාණය හා සංවර්ධනය

**iv. සැපයුම් අංශය**

- පුහුණු කටයුතු සඳහා වන ඇණවුම් යොමු කිරීම
- ආහාර ද්‍රව්‍ය භාර ගැනීම
- මුළුතැන්ගෙය වෙත නිකුත් කිරීම
- මුළුතැන්ගෙය අධීක්ෂණ කටයුතු

**v. සංවර්ධන හා නඩත්තු අංශය**

- ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම
- අක්කර 35 භූමිය අලංකාරවත් ලෙස තබාගැනීම.
- යටිතල පහසුකම් සංවර්ධනය හා පවත්වාගෙන යාම

**6. මානව සම්පත් පැතිකඩ :**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 05 | 03 | 02 |
| තෘතියික | 01 | 01 | - |
| ද්විතියික | 36 | 34 | 02 |
| ප්‍රාථමික | 33 | 23 | 10 |
| **එකතුව** | **75** | **61** | **14** |

**7. 2025.09.30 දිනට ළඟා කරගත් ඉලක්ක**

| අ/අ | වැඩසටහන් වර්ගය | 2025 වර්ෂය සඳහා සැලසුම් කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | 2025.09.30 දින වන විට පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 2025 වර්ෂය සඳහා සැලසුම් කරන ලද පුහුණුලාභීන් සංඛ්‍යාව | 2025.09.30 දින දක්වා පුහුණුලාභීන් සංඛ්‍යාව | 2025.09.30 දින දක්වා ආදායම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 01. | නායකත්ව කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් | 75 | 59 | 5625 | 3846 | 12.50 |
| 02. | විෂය මූලික පුහුණු වැඩසටහන් | 50 | 39 | 3750 | 3391 | 9.50 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 03. | පසු විපරම් සහ ප්‍රවර්ධන වැඩසටහන් | 25 | 09 | - | - | - |
| 04. | ආහාර දේශන ශාලා සහ නේවාසිකාගාර පහසුකම් සැපයීම | - | - | - | - | 2.60 |
| | **එකතුව** | **150** | **107** | **9375** | **7237** | **24.60** |

**8. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය (2025.09.30 දිනට)**

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන්කළ මුදල (රු.මි) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මි) | 2025.09.30 දිනට | | |
|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
| 01 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 20.00 | - | 0.34 | 2 | 30 |
| 02 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු | 0.80 | - | 0 | 0 | 35 |
| 03 | වාහන නඩත්තු | 1.50 | - | 0.17 | 11 | 70 |
| 04 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය අවශ්‍යතා මිල දී ගැනීම් | 3.00 | - | 1.32 | 44 | 70 |
| 05 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම් | 3.50 | - | 0.65 | 19 | 60 |
| 06 | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් | 1.00 | - | 0.45 | 45 | 75 |
| 07 | නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් | 40.20 | - | 15.33 | 38 | 70 |

**9. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 2025.09.30 දිනට**

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | 2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|
| | | (රු.මි.) | (%) |
| පුනරාවර්තන වියදම | 76.00 | 55.77 | 73 |
| ප්‍රාග්ධන වියදම | 70.00 | 18.26 | 26 |
| **එකතුව** | **146.00** | **74.03** | **50** |

**10. 2025 වර්ෂය තුළ ලබාගත් විශේෂ ජයග්‍රහණ**

- 2024 දෙසැම්බර් මස දී නායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා Adventure Based Training ඇතුළත් කරන ලද අතර 2025.09.30 දින වන විට Adventure Based Training සහිත පුහුණු වැඩසටහන් 29 කදී පුහුණුලාභීන් 1500 කට ආසන්න ප්‍රමාණයක් පුහුණු කිරීම.



- මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්වලින් සහ බාහිර ආයතන සඳහා පහසුකම් සැපයීම මගින් රු. මි. 24.60 ක ආදායම් ඉපයීම

## 11. 2026-2029 ඉදිරි ඉලක්ක

- 2026 වර්ෂයේ සිට 2029 වර්ෂය දක්වා පැවැත්වීමට සැලසුම් කර ඇති වැඩසටහන් සහ ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අ/අ | වැඩසටහන් වර්ගය | විස්තරය | 2026 | 2027 | 2028 | 2029 |
|---|---|---|---|---|---|---|
| 01. | නායකත්ව කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 80 | 82 | 85 | 85 |
| | | පුහුණුලාභීන් සංඛ්‍යාව | 6000 (80x75) | 6150 (82x75) | 6375 (85x75) | 6375 (85x75) |
| | | වියදම (රු.මි.) | 12.00 | 13.50 | 15.00 | 16.00 |
| 02. | විෂය මූලික පුහුණු වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 50 | 52 | 55 | 55 |
| | | පුහුණුලාභීන් සංඛ්‍යාව | 4000 (50x80) | 4160 (52x80) | 4400 (55x80) | 4400 (55x80) |
| | | වියදම (රු.මි.) | 10.00 | 11.00 | 12.00 | 16.00 |
| 03. | පසු විපරම් සහ ප්‍රවර්ධන වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 30 | 30 | 30 | 30 |
| | | වියදම (රු.මි.) | 03.00 | 03.00 | 03.00 | 03.00 |

# ජාතික ක්‍රීඩා විද්‍යායතනය

# ජාතික ක්‍රීඩා විද්‍යායතනය

## 1. හැඳින්වීම

ක්‍රීඩා පාසල නමින් 1979 වර්ෂයේ දී ආරම්භ වු මෙම ආයතනය 1998 වර්ෂයේ දී විශේෂ පාර්ලිමේන්තු පනතක් මඟින් ජාතික ක්‍රීඩා විද්‍යායතනය ලෙස ස්ථාපිත කරන ලදී . ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනයේ ප්‍රමුඛ ආයතනය වෙමින් ක්‍රීඩාවේ උන්නතිය උදෙසා ප්‍රබල දායකත්වයක් ලබාදෙමින් ක්‍රීඩා දැනුම සමාජගත කිරීමේ කාර්ය ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් ඉටු කරනු ලබයි.

දේශීය සහ ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ ළඟා කර ගැනීමට දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම, යාවත්කාලීන කිරීම මෙන්ම ක්‍රීඩාවේ විවිධ ස්ථරයන්ගේ මානව සම්පත් සංවර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම ක්‍රියාශීලී දිවිපෙවෙතක් උරුම කර දීමට ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ කෙටිකාලීන හා දිගුකාලීන උපායමාර්ග සහ සැලසුම් තුළින් අරමුණු කෙරේ.

## 2. දැක්ම

"ක්‍රීඩා අධ්‍යාපනයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ආයතනය වීම."

## 3. මෙහෙවර

ක්‍රීඩා ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම, ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන්ගේ නිපුණතා, ශාක්‍යතා, දක්ෂතා, සහ දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රීඩා අධ්‍යාපනය ලබාදීම තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

## 4. අරමුණු

i. ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාලීන අවශ්‍යතා හඳුනාගෙන ක්‍රීඩා අධ්‍යාපන සුදුසුකම් සපුරාලීම සඳහා පාඨමාලා නිර්මාණය කිරීම, සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම.

ii. නව ක්‍රීඩා දැනුම ග්‍රාමීය මට්ටමින් ලබාදීම අරමුණු කර ගනිමින් කෙටිකාලීන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් මඟින් නව ක්‍රීඩා දැනුම ග්‍රාමීය ප්‍රදේශ වෙත ගෙනයාම.

## 5. ප්‍රධාන කාර්යයන්

| # | කාර්යය | ඉලක්ක කණ්ඩායම |
|---|---|---|
| 1 | I. අංක 1973/25 දරණ ක්‍රීඩා පනතේ විධිවිධාන වලට අනුව මෙන්ම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 4, NVQ 5, NVQ 6) සඳහා අනුකූල වන පරිදි ක්‍රීඩා පාඨමාලාවන් පැවැත්වීම.<br>• උසස් පුහුණුකරු පාඨමාලාව (NVQ 6)<br>• ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5)<br>• ශරීර සුවතා උපදේශක පුහුණු පාඨමාලාව (NVQ 4)<br>II. ක්‍රීඩා කළමණාකරනය, ක්‍රීඩා ආබාධ කලමණාකරනය ඇතුළු ක්ෂේත්‍ර ආවරණය කරමින් ක්‍රීඩා පාඨමාලා/ පුහුණු වැඩසටහන් පැවැත්වීම. | පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන උපගුරුවරුන්, ආරක්ෂක අංශයන්හි ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්, ජාත්‍යන්තර සහ ජාතික මට්ටමෙන් තරඟ කල ක්‍රීඩකයන්, ක්‍රීඩා මාධ්‍යවේදීන්. |
| 2 | ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම | ක්‍රීඩා ක්ෂේත්‍රයේ සියළුම පාර්ශවයන්. |
| 3 | ක්‍රීඩා යටිතල පහසුකම් සැපයීම | ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ සියළුම ආයතන. |

| | | |
|---|---|---|
| 4 | ශරීර සුවතා වැඩසටහන් පැවැත්වීම | ශරීර සුවතාව හා ඒ පිළිබඳ දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන රාජ්‍ය නිලධාරීන් ඇතුළු මහජනතාව . |
| 5 | ක්‍රීඩා සේවයේ නිලධාරීන් සඳහා කාර්යාක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තු වල පුහුණුකරුවන් හා ක්‍රීඩා නිලධාරීන්. |
| 6 | ක්‍රීඩා පුහුණුකරුවන්ගේ කුසලතා සහ ආකල්ප සංවර්ධනය කර ඔවුන් සඳහා පුහුණුකරු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම | සියළුම ජාතික ක්‍රීඩා සංගම් හා ඊට අයත් පුහුණුකරුවන්. |
| 7 | අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා කාර්යාක්ෂමතා කඩඉමක් ලෙස ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීම. | අධ්‍යාපන අමාත්‍යාංශයට බඳවා ගත් නවක ක්‍රීඩා පුහුණුකරුවන්. |
| 8 | ත්‍රිවිධ හමුදාවල සහ පොලිසියේ ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම | ත්‍රිවිධ හමුදාවේ සහ පොළීසියේ ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්. |
| 9 | පාසල් ළමුන්ගේ 13 වසරක අධ්‍යාපනය සහතික කිරීම සඳහා පවත්වනු ලබන NVQ 04 මට්ටමේ ක්‍රීඩා පාඨමාලාව | උසස් පෙළ හැදෑරීම සඳහා සුදුසුකම් නොමැති ක්‍රීඩාව කෙරෙහි දක්ෂතා ඇති පාසල් සිසුන්. |

**6.** **මානව සම්පත් පැතිකඩ :**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 07 | 01 | 06 |
| තෘතියික | 11 | 08 | 03 |
| ද්විතියික | 29 | 15 | 14 |
| ප්‍රාථමික | 07 | 04 | 03 |
| **එකතුව** | **54** | **28** | **26** |

**7. 2025.09.30 දිනට ළගා කරගත් ඉලක්ක**

ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ මූලික කාර්යය ක්‍රීඩා අධ්‍යාපනය ලබාදීම වන අතර 2025 වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වා පවත්වන ලද පාඨමාලා සහ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

| | පාඨමාලාව/වැඩසටහන | ඉලක්ක කණ්ඩායම | අභ්‍යාසලාභීන් ගණන |
|---|---|---|---|
| 1 | පුහුණුකරු උසස් පාඨමාලාව (NVQ 6) | ක්‍රීඩා නිළධාරීන්, පුහුණුකරුවන් | 10 |
| 2 | ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා (NVQ 5) | දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩකයින්, ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසල් වල ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, ආරක්ෂක අංශ වල ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් | 36 |
| 3 | ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව (සති අන්ත) | අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් | 118 |
| 4 | ක්‍රීඩා කළමණාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරීන්, පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්, | 24 |

| | | | |
|---|---|---|---|
| | | ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධ අනෙකුත් ආයතනයන්ගේ නිලධාරීන් | |
| 5 | ශරීර සුවතා උපදේශක පුහුණු පාඨමාලාව NVQ 4 | ශාරීරික සුවතා උපදේශකයින්, ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, ස්වේච්ඡා උපදේශකයින් | 80 |
| 6 | ක්‍රීඩා ආබාධ කළමණාකරණ සහතික පත්‍ර පාඨමාලාව | ක්‍රීඩකයින්, පුහුණුකරුවන් | 17 |
| 7 | ස්වායු ව්‍යායාම උපදේශක පුහුණු පාඨමාලාව | ස්වායු ව්‍යායාම උපදේශකයින් සහ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් | 40 |
| 8 | ක්‍රීඩා මනෝවිද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | ක්‍රීඩා මනෝවිද්‍යාව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් | 27 |
| 9 | ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - මළල ක්‍රීඩා | අදාල ක්‍රීඩාවන්හි ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ලියාපදිංචි වූ පුහුණුකරුවන්. (ලියාපදිංචිය අලුත් කිරීම සඳහා මෙම එක් දින වැඩසටහන පැවැත්වේ.) | 22 |
| 10 | ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - බැඩ්මින්ටන් | | 53 |
| 11 | ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - බොක්සිං | | 12 |
| 12 | ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - හොකී | | 07 |
| 13 | ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - කරාතේ | | 172 |
| 14 | ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - කබඩි | | 04 |
| 15 | ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - බර ඉසිලීම | | 30 |
| 16 | ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - Hand Gun | | 17 |
| 17 | ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - පිහිණුම් | | 24 |
| 18 | ක්‍රීඩා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (බර ඉසිලීම) - අදියර I | පුහුණුකරුවන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 36 |
| 19 | ක්‍රීඩා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (මල්ලවපොර) - අදියර I | පුහුණුකරුවන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 27 |

| | | | |
|---|---|---|---|
| 20 | ක්‍රීඩා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (දැල්පන්දු) - අදියර I | පුහුණුකරුවන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 46 |
| 21 | ක්‍රීඩා අභ්‍යාසක සහතික පත්‍ර පාඨමාලාව | අ.පො.ස. (සා.පෙළ) සමත් සහ අ.පො.ස (උ. පෙළ) හැදෑරීමට නොහැකි පාසල් දරුවන් | 14 |
| 22 | වෙරළ ක්‍රීඩා පුහුණු වැඩසටහන | ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන් | 58 |
| 23 | ක්‍රීඩා පාසල්හි පුහුණුකරුවන් සහ ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සඳහා පාසල් ක්‍රීඩා පුහුණු වැඩසටහන - වැලිමඩ | පාසල් ක්‍රීඩා පුහුණුකරුවන්, ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් | 65 |
| 24 | ඉහල උන්නතාංශ ක්‍රීඩා පුහුණු වැඩසටහන | ක්‍රීඩා පුහුණුකරුවන් | 60 |
| 25 | දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු වැඩසටහන් - දිස්ත්‍රික් 03ක් සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඇත | ක්‍රීඩා නිලධාරීන්, පුහුණුකරුවන් | 184 |
| | **පුහුණු කර ඇති / දැනුම ලබා දී ඇති සමස්ත සංඛ්‍යාව** | | **1183** |

## 8. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය (2025.09.30 දිනට)

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන්කළ මුදල (රු.මි.) | 2025.09.30 දිනට | | |
|---|---|---|---|---|---|
| | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
| **1** | ක්‍රීඩා නව්‍යකරණ ව්‍යාපෘතිය | 28.00 | 11.96 | 43 | 50 |
| **2** | මානව සම්පත් සංවර්ධනය | 0.70 | 0.44 | 63 | 70 |
| **4** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 15.00 | - | - | - |
| **5** | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 1.30 | 0.46 | 36 | 40 |
| | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | | | |
| **6** | ගොඩනැඟිලි හා ඉදිකිරීම | 1.50 | - | - | 50 |
| **7** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1.00 | - | - | - |
| **8** | වාහන | 0.50 | - | - | - |
| | **එකතුව** | **48.00** | **12.86** | **27** | **30** |

**9. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 2025.09.30 දිනට**

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව | 2023.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | (රු.මි.) | (%) |
| පුනරාවර්තන වියදම | 65.00 | 65.00 | 34.80 | 54 |
| ප්‍රාග්ධන වියදම | 48.00 | 48.00 | 12.86 | 27 |
| **එකතුව** | **113.00** | **113.00** | **47.67** | **42** |

**10. 2025 වර්ෂය තුළ ලබාගත් විශේෂ ජයග්‍රහණ (ඡායාරූප ද සමඟ)**

ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් 2025 වර්ෂය තුල පැවැත්වූ විශේෂ ක්‍රීඩා පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

- 2025 වර්ෂය තුල දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු වැඩසටහන් තුනක් පැවැත්වීම.



දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු වැඩසටහන - හම්බන්තොට

- ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් ඉහළ උන්නතාංශ ක්‍රීඩා පුහුණු වැඩසටහනක් නුවරඑළියේ දී පවත්වන ලදී.



ඉහළ උන්නතාංශ ක්‍රීඩා පුහුණු වැඩසටහන පැවැත්වීම.

- ක්‍රීඩා කළමණාකරණය පිළිබඳ ක්‍රීඩා ක්ෂේත්‍රයේ සිටින පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීම සඳහා ක්‍රීඩා කළමණාකරන ඩිප්ලෝමා පාඨමාලාවක් 2025 වර්ෂයේ දී පවත්වන ලද අතර ඒ තුල නායකත්ව සංවර්ධන විශේෂ පුහුණු වැඩසටහනක් ද අන්තර්ගත කර තිබුණි. එම වැඩසටහන ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.



ක්‍රීඩා කළමණාකරන ඩිප්ලෝමා පාඨමාලාව නායකත්ව පුහුණුව

## 11. 2026-2029 ඉදිරි ඉලක්ක

i. 2028 වර්ෂයේ දී පැවැත්වීමට නියමිත ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ පරිසාධන මට්ටමට ළඟාවිය හැකි ක්‍රීඩා පුහුණු කරනු ලබන පුහුණුකරුවන්ට නව තාක්ෂණික දැනුම ලබාදෙමින් අදාල ඉලක්ක වෙත ළඟාවීමට විදේශ සම්පත්දායකයින් යොදාගනිමින් කෙටිකාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

ii. 2026 වර්ෂයේ දී ආසියාතික සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලවල දී පදක්කම් ජයග්‍රහණය කල හැකි ක්‍රීඩාවන් ඉලක්ක කර ගනිමින් උසස් පුහුණුකරු පාඨමාලාවන් පැවැත්වීම.

iii. ව්‍යායාම් මධ්‍යස්ථානයන් හී පුහුණු උපදේශකයින් සහ ඒ පිළිබඳ උනන්දුවක් ඇති පාසල් හැරගිය තරුණ තරුණියන් ඉලක්ක කර ගනිමින් දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපලට අවතීර්ණ වීමට හැකි වන පරිදි ව්‍යායාම සහ එම උපකරණ භාවිතය පිළිබඳව නිවැරදි දැනුම ලබාදීම වෙනුවෙන් පුහුණු පාඨමාලා පැවැත්වීම.

iv. අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් ක්‍රීඩාවේ එක් එක් ක්ෂේත්‍රයන් වෙත නව ක්‍රීඩා පාඨමාලා සහ පුහුණු වැඩසටහන් නිර්මාණය කිරීම සහ පැවැත්වීම.

SLADA

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

## 1. හැඳින්වීම -

වර්තමානයේ ජාතික ජාත්‍යන්තර ක්‍රීඩා ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් වාණිජකරණය වී තිබේ තිබේ. ඒ හේතුවෙන් වර්තමාන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හුදෙක්ම ජයග්‍රහණය අරමුණු කොට ගෙන ක්‍රීඩා කිරීමට යොමු වී තිබේ. මෙහිදී පවතින දැඩි තරගකාරීත්වය නිසාම නීත්‍යානුකූල නොවන ක්‍රමවේද භාවිතා කර හුදු ජයග්‍රහණ ලබා ගැනීමට ඔවුන් පෙළඹී තිබේ.

මේ හේතුවෙන් ක්‍රීඩාවේදී තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම කරළියට පැමිණ තිබේ. ජාතික මෙන්ම ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවල දී මෙම තහනම් ද්‍රව්‍ය භාවිතය තුළින් ක්‍රීඩාවේ අව්‍යාජ භාවයට හානි සිදුකරනවා සේම අවසානයේ රටක් ලෙස ජාත්‍යන්තරය ඉදිරියේ අපකීර්තියට පත්ව රටේ ජවසම්පන්න මතු පරපුර සෞඛ්‍ය අතින් පරිහානියට ද පත් වේ.

ජාත්‍යන්තර මට්ටමෙන් තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා 1999 කැනඩාවේ මොන්ට්‍රියල් නුවර කේන්ද්‍ර කොටගෙන ක්‍රියාත්මක වන ලෝක තහනම් උත්තේජක මර්දන ආයතනය අනුගමනය කරමින් 2013 වසර තෙක්ම ශ්‍රී ලාංකික ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ ඒ පිළිබඳව නිරූපණය කිරීම් ක්‍රීඩා වෛද්‍ය ආයතනය මගින් සිදුවිය.

මෙම විෂය ඉටු කිරීම සඳහා ස්වාධීනව කටයුතු කරන වෙනම ම ආයතනයක අවශ්‍යතාවය ඒ වන විටත් මතුවෙමින් තිබුන බැවින් 2013 වර්ෂයේ නොවැම්බර් 18 වැනි දින දී "2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත" සංස්ථාපනය කෙරුණි. එම පනතේ තුන්වන කොටස යටතේ තහනම් ද්‍රව්‍ය සහ තහනම් ක්‍රම ශ්‍රී ලංකාවෙන් මුලිනුපුටා දැමීම වන විෂය තේමා කර ගත් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නමින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බිහි කරනු ලැබේ.

දැනට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස කටයුතු කරයි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රමුඛ පරමාර්ථය වනුයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩාවේ දී භාවිතා නොකළ යුතු තහනම් උත්තේජක මුලිනුපුටා දැමීම හා යහපත් පිරිසිදු භාවයෙන් යුතු ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීමයි.

## 2. දැක්ම -

"නිවැරදි හා සාධාරණ ජයග්‍රහණයක් උදෙසා තහනම් ද්‍රව්‍යවලින් තොර ශ්‍රී ලාංකීය ක්‍රීඩා ජවයක්"

## 3. මෙහෙවර -

ලෝක මත්ද්‍රව්‍ය නිවාරණ පනත සහ එහි රෙගුලාසිවලට අනුකූල වන ආකාරයට 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීම.

## 4. අරමුණු

i. ශ්‍රී ලංකාවේ ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කිරීමට සහය දැක්වීම.
ii. ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් රජය, ක්‍රීඩා අමාත්‍යාංශය සහ ජාතික ඔලිම්පික් කමිටුව දැනුවත් කිරීම.
iii. 2021 ලෝක තහනම් උත්තේජක මර්දන නීති සංග්‍රහය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් ශ්‍රී ලංකාව පුරා ක්‍රියාවට නැංවීමට ප්‍රමුඛ වීම.
iv. වාණිජමය පදනමින් අදාළ වන ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි කලාපීය තහනම් උත්තේජක මර්දන ආයතනය ඇතුළුව අනෙකුත් තහනම් උත්තේජක මර්දන

ආයතන සමග යාවත්කාලීන වූ තහනම් උත්තේජක මර්දන භාවිතයන් සහ විශේෂඥ දැනුම බෙදා ගැනීම.

v. WADA සහ NADOs ඇතුළු බලගතු උත්තේජක මර්දන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

vi. ජාතික වැදගත්කමක් ඇති ඉහළ මට්ටමේ ක්‍රීඩා ඉසව් සඳහා විශේෂඥ තහනම් උත්තේජක මර්දනය සම්බන්ධ උපදෙස් සහ මගපෙන්වීම ලබා දීම.

vii. සියලු ම ප්‍රධාන ඉසව් සම්බන්ධ වගකීම් ලෝක මට්ටමේ ප්‍රමිතියට අනුව ඉටු කිරීම.

viii. තහනම් උත්තේජක භාවිතය වැළැක්වීම සඳහා අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ වැඩසටහනක් ලබා දීම.

ix. අභ්‍යන්තරව හා බාහිරව විශේෂඥයන් යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතයේ අවදානම අඛණ්ඩව ඇගයීමට ලක් කිරීම.

x. නීතිය බලාත්මක කිරීම ඇතුළුව පවතින කඳවුරු තුලින් බුද්ධි තොරතුරු රැස් කිරීම පිළිබඳ නිපුණතා වැඩි කිරීම.

xi. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා හා අධ්‍යාපනික දර්ශනය, අධ්‍යාපනික වැඩසටහන් හරහා වැළැක්වීම මත පදනම් වූ සාරධර්ම ශක්තිමත් කිරීම, ඉතා සුදුසු ප්‍රායෝගික මෙවලම් සහ උපකාරක සේවා වර්ධනය මගින් සහාය වීම.

xii. බුද්ධි තොරතුරු ප්‍රමුඛ, ජවසම්පන්න සහ ප්‍රතිග්‍රාහක පරීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

xiii. තහනම් උත්තේජක මර්දන නීති උල්ලංඝණය කිරීම දැඩි ලෙස විමර්ශනය කර නඩු පැවරීම.

xiv. ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ භාවිතයන් යොදා ගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ඒකාකාර ක්‍රීඩා පිටියක් ප්‍රවර්ධනය කිරීම.

**5. ප්‍රධාන කාර්යයන්**

i. තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීම.
ii. තහනම් උත්තේජක පිළිබඳව ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීම.
iii. තහනම් උත්තේජක සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම.
iv. තහනම් උත්තේජක නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධ නීතිමය කටයුතු සිදු කිරීම.

**6. මානව සම්පත් පැතිකඩ :**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 10 | *08 | 03 |
| තෘතියික | 03 | 02 | 01 |
| ද්විතියික | 09 | 04 | 05 |
| ප්‍රාථමික | 07 | 04 | 03 |
| **එකතුව** | **29** | **18** | **12** |

*වැඩ බලන - 01

**7. 2025.09.30 දිනට ළගා කරගත් ඉලක්ක**

i. සැලසුම් කළ පරිදි අධ්‍යාපන වැඩසටහන්, තහනම් උත්තේජක පරීක්ෂණ, පර්යේෂණ යනාදි ඉලක්ක ලගා කර ගැනිම.

ii. 2024 වර්ෂයේ සිදු කරන ලද පිරිසිදු ක්‍රීඩාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවේ පුහුණු කරන ලද අධ්‍යාපනඥයින් හතළිස්දෙනා සක්‍රීයව දිවයින පුරා අධ්‍යාපන වැඩසටහන් සඳහා යෙදවීම සහ

ඒ තුළින් දිවයින පුරා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ ක්‍රීඩාවට සම්බන්ධ සෙසු පාර්ශව දැනුවත් කිරීමේ වැඩසටහන් සාර්ථක කර ගැනිම.

iii. ශ්‍රී ලංකාවේ පළමු වතාවට සම්පූර්ණ සිංහල මාධ්‍යයෙන් නොමිලේ මාර්ග ගත ක්‍රමය ඔස්සේ හැදෑරිය හැකි සහතික පත්‍ර පාඨමාලාවක් සමාජගත කිරීම සහ මේ වන විට 100 කට අධික ප්‍රමාණයක් සාර්ථකව එම පාඨමාලාව හදාරා සහතික පත්‍ර ලබා ගෙන තිබිම.

iv. පිරිසිදු ක්‍රීඩාව සම්බන්ධ තේමාව යටතේ දිපව්‍යාප්ත චිත්‍ර තරගාවලියක් බාණ්ඩ කිපයක් යටතේ පැවැත්විම සහ එහි ජයග්‍රාහකයින්ට ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහතික පත්‍ර සහ ත්‍යාග මුදල් ලබාදිම මෙන්ම එදිනම විශාකා විද්‍යාලය සහ රාජකිය විද්‍යාලය අතර තහනම් උත්තේජක භාවිතය සම්බන්ධයෙන් ප්‍රදර්ශනාත්මක විවාද තරගයක් පැවැත්වීම.

v. තහනම් උත්තේජක මාතෘකා කර ගනිමින් සමස්ථ ලංකා විවාද තරගාවලියක් පැවැත්විම.

vi. තහනම් ද්‍රව්‍ය තනිවම පරීක්ෂා කර ගැනිමට හැකි ජංගම දුරකථන යෙදවුමක් නිර්මාණය කිරීම.

vii. තහනම් උත්තේජක පිළිබඳ දකුණු ආසියානු සමුළුව දකුණු ආසියානු සියලුම රටවල් වල සහභාගිත්වයෙන් කොළඹ දි පැවැත්වීම.

**8. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය (2025.09.30 දිනට)**

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන් කල මුදල (රු.මිලි) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මිලි) | 2025.09.30 දිනට | | |
|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
| 1 | තහනම් උත්තේජක පරීක්ෂණ | 22.00 | - | 7.81 | 36 | 64 |
| 2 | තහනම් උත්තේජක පිළිබද අධ්‍යාපනය | 1.12 | - | 0.82 | 73 | 68 |
| 3 | බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම | 2.00 | - | 0.59 | 29 | 67 |
| 4 | පර්යේෂණ හා සංවර්ධන | 6.00 | - | 0.62 | 10 | 74 |
| 5 | ධාරිතා සංවර්ධනය | 2.50 | - | 0.29 | 12 | 48 |
| 6 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම. | 3.50 | - | 1.48 | 42 | 55 |
| 7 | ප්‍රාග්ධන උපකරණ අත්පත් කරගැනීම | | | | | |
| 7.1 | ගොඩනැගිලි හා ඉදිකිරීම් (Rectification work of Head Office Building) | 11.79 | - | 0.00 | 0 | 35 |
| 7.2 | CECB වෙත අතිරේක උපදේශන ගාස්තු ගෙවීම, Hayleys Solar වෙත ගෙවීම | 7.04 | - | 4.22 | 60 | 60 |
| 7.3 | ප්‍රධාන මෙහෙයුම් කටයුතු වන අධ්‍යාපන, පර්යේෂණ හා නිති බලාත්මක අංශ සදහා අවශ්‍ය ප්‍රාග්ධන උපකරණ මිළදී ගැනීම | 1.05 | - | 0.13 | 13 | 20 |

**9.** **වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 2025.09.30 දිනට**

| **විස්තරය** | **වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.)** | **ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව** | **2023.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය** | |
|---|---|---|---|---|
| | | | **(රු.මි.)** | **(%)** |
| පුනරාවර්තන වියදම | 70.00 | - | 42.76 | 61 |
| ප්‍රාග්ධන වියදම | 57.00 | - | 15.97 | 28 |
| **එකතුව** | **127.00** | **-** | **58.73** | **46** |

**10.** **2025 වර්ෂය තුළ ලබාගත් විශේෂ ජයග්‍රහණ (ඡායාරූප ද සමඟ)**

**i.** **අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම**
















ii. මාර්ග ගත ක්‍රමය ඔස්සේ හැදෑරිය හැකි පාඨමාලාව සමාජගත කිරීම



iii. දීප ව්‍යාප්ත චිත්‍ර තරගාවලිය පැවැත්වීම









**iv. තහනම් උත්තේජක මාතෘකා කර ගනිමින් සමස්ථ ලංකා විවාද තරගාවලියක් පැවැත්වීම**




## 11. ඉදිරි ඉලක්ක 2026-2029

i. නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ නව පනත සංශෝධනය කිරීමෙන් අනතුරුව ලෝක උත්තේජන මර්දන ආයතනයෙන් නිකුත්වීමට නියමිත ලෝක තහනම් උත්තේජක නීති සංග්‍රහයට අනුකූලව නව ගමනක් යෑම සඳහා අධ්‍යාපන වැඩසටහන්, පර්යේෂණ සහ පරීක්ෂණ ශ්‍රී ලංකාව තුළ සිදු කිරීම.

ii. පිරිසිදු ක්‍රීඩා අධ්‍යාපනය ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ජාතික මට්ටමින් පහළ ක්‍රීඩා සමාජ සහ පාසල් මට්ටම දක්වා ගෙනයාමට කටයුතු කිරීම.

iii. විශ්ව විද්‍යාල සමඟ සයෝගිතාවයන් ඇති කර ගනිමින් ඔවුන් සමඟ එකාබද්ධ වී වැඩි පර්යේෂණ සංඛ්‍යාවක් සිදු කිරීමට කටයුතු කිරීම.

iv. වඩාත් ඉලක්කගත තහනම් උත්තේජක පර්යේෂණ සිදු කර තහනම් උත්තේජක ක්‍රීඩාවෙන් මුලිනුපුටා දැමීමට සැළසුම් කිරීම.

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

## 1. හැඳින්වීම

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාරකාර අරමුදලක් ලෙස 1995.02.01 දින සිට ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගනු ලැබූ අතර, 1999 අප්‍රේල් මස 20 වෙනි දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියක් බවට පත් කිරීමේ 1999 අංක 17 දරන පනත හා 2017 අගෝස්තු මස 28 දිනැති 2017 අංක 14 දරන (සංශෝධන) පනත ප්‍රකාරව පාලනය කරනු ලැබේ.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පිහිටි විශාලතම ක්‍රීඩා සංකීර්ණය වන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය තුල ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ක්‍රීඩා යටිතල පහසුකම් සලසනු ලැබේ. එමෙන්ම ආසන 5,000 ක ධාරිතාවකින් යුත් වායු සමීකරණය කරන ලද දිවයින තුල පිහිටි විශාලතම ගෘහස්ථ ක්‍රීඩාංගණය මෙම ක්‍රීඩා සංකීර්ණය තුල පිහිටා ඇත. මෙම ආයතනය විසින් ජාතික ක්‍රීඩා ආයතන, ජාතික ක්‍රීඩා සමාජ, ක්‍රීඩා සමාජ සහ පාසල් වල ක්‍රීඩා ඉසව්වලට පමණක් නොව ත්‍රිවිධ හමුදාව, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන, විශ්වවිද්‍යාල, රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන විසින් පවත්වනු ලබන ක්‍රීඩා හා ක්‍රීඩා නොවන විවිධ වැඩ සටහන් සඳහා අවශ්‍ය පහසුකම් සඳහා භාවිතා කරනු ලබයි.

## 2. දැක්ම

"දකුණු ආසියාවේ පළමු පෙලේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බවට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පත්කිරීම සහ එය සතු අනෙකුත් ක්‍රීඩා සංකීර්ණ දියුණු කිරීම තුලින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනයට පහසුකම් සහනදායිව ලබාදීම."

## 3. මෙහෙවර

ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම මගින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුවට දායකවීම සහ ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගේ කුසලතා ඔප් නැංවීමට ඇවැසි පහසුකම් සහිත ආසියානු කලාපයේ ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සහිත ප්‍රමුඛතම ජාත්‍යන්තර සංකීර්ණයක් බවට පත්වීම.

## 4. අරමුණු

i. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම, සුරැකීම සහ සංවර්ධනය කිරීම.

ii. ක්‍රීඩා ආර්ථිකයේ සහ ක්‍රීඩා සංචාරක ව්‍යාපාරයේ අවශ්‍යතා සපුරාලීමට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු හා පහසුකම් වැඩි දියුණු කිරීම.

iii. රටෙහි ක්‍රීඩා අභිවෘද්ධිය වෙනුවෙන් සුගතදාස ක්‍රීඩා සංකීර්ණයේ පවතින පහසුකම් සැපයීම.

iv. සමාජ ඒකාබද්ධතාවට හා ජාතිය ගොඩනැගීමට උපකාරී වන ක්‍රමවේද ලෙස ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු යොදාගනු ලැබීම සහතික කිරීම.

## 5. ප්‍රධාන කාර්යයන්

i. ජාතික ක්‍රීඩා සංගම්, පාසල් ක්‍රීඩා සංගම් හා රාජ්‍ය මෙන් ම පෞද්ගලික ආයතන සඳහා කළමනාකාරීත්ව මණ්ඩලය මගින් අනුමත කළ ගාස්තු යටතේ සේවා හා පහසුකම් සැපයීම.

ii. ජාතික හා ජාත්‍යන්තර ජවන හා පිටිය ක්‍රීඩා තරග සඳහා ක්‍රීඩක - ක්‍රීඩිකාවන් පුහුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

iii. ජාත්‍යන්තර මට්ටමේ තරග දිවා කාලයේ දී මෙන් ම රාත්‍රී කාලයේදී පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

iv. අඩු පහසුකම් සහිත පාසැල් හා ග්‍රාමීය මට්ටමේ දක්ෂතා සපිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයා දීම මඟින් ඔවුන්ගේ දක්ෂතා වැඩිදියුණු කරගෙන ඉදිරියට ඒමට අවශ්‍ය පහසුකම් සැපයීම.

v. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරග පැවැත්වීමට අවශ්‍ය පිහිණුම් හා කිමිදුම් තටාකාංගන පහසුකම් සැපයීම.

vi. විභාග, සම්මන්ත්‍රණ, සමුළු, උත්සව සහ විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

vii. පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.

## 6. මානව සම්පත් පැතිකඩ:

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 11 | 3 | 8 |
| තෘතියික | 11 | 9 | 2 |
| ද්විතියික | 73 | 47 | 27 |
| ප්‍රාථමික | 281 | 178 | 99 |
| **එකතුව** | **376** | **237** | **136** |

## 7. 2025.09.30 දිනට ළඟා කරගත් ඉලක්ක

i. එළිමහන් ක්‍රීඩාංගණයේ මාධ්‍ය ගොඩනැගිල්ල නවීකරණය කර පාරිභෝගිකයන්ගේ පරිහරණය සඳහා ලබා දීම.

ii. ගෘහස්ථ ක්‍රීඩාංගණයේ ජලකාන්දු සහිත ස්ථාන සකස් කිරීම, සිවිලිම ශක්තිමත් කිරීම ආදී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුලින් භාවිතා කරන්නන් හට සුරක්ෂිත සේවාවක් ලබා දීමට හැකිවීම.

## 8. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය (2025.09.30 දිනට)

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන්කළ මුදල (රු.මිලි) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මිලි) | 2025.09.30 ට | | |
|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
| 01 | එළිමහන් ක්‍රීඩාංගණයේ මාධ්‍ය ගොඩනැගිල්ල සහ ප්‍රේක්ෂකාගාරයේ වහල නවීකරණය කිරීම. | 42.00 | 42.00 | 36.45 | 87 | 100 |
| 02 | ගෘහස්ථ ක්‍රීඩාංගණය නවීකරණය | 30.00 | 30.00 | 17.95 | 60 | 85 |
| 03 | එළිමහන් ක්‍රීඩාංගණය වටා ඇති වැට අලුත්වැඩියාව | 2.80 | 2.80 | 4.03 | 144 | 100 |
| 04 | ගෘහස්ථ ක්‍රීඩාංගණයේ ගිනි නිවීමේ පද්ධතිය නවීකරණය | 4.50 | 4.50 | - | - | 10 |
| 05 | CCTV කැමරා පද්ධතිය නවීකරණය කිරීම | 1.50 | 1.50 | 1.04 | 69 | 99 |
| 06 | ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම | 1.50 | 1.50 | - | - | 65 |
| 07 | පිහිණුම් තටාක ප්‍රේක්ෂකාගාරයේ පුටු අලුතින් මිලදී ගෙන සවි කිරීම (අදියර 2) | 11.50 | 11.50 | 10.82 | 94 | 95 |
| 08 | SNSCA හි පිහිණුම් තටාක ජල පිරිපහදු පහසුකම් නවීකරණය | 15.40 | 15.40 | 9.79 | 64 | 100 |
| 09 | ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුතු මීටර් 400 / මීටර් 200 හා මීටර් 80 කෘතිම ධාවන මංතීරුව නැවත ඇතිරීම සහ අදාළ යටිතල පහසුකම් නවීකරණය | 500.00 | 500.00 | - | - | 2 |
| 10 | පාපන්දු පිටිය නවීකරණය | 5.00 | 5.00 | 0.65 | 13 | 60 |
| 11 | එළිමහන් ක්‍රීඩාංගණයේ ප්‍රේක්ෂක වේදිකාව සහ වහලය ප්‍රතිසංස්කරණය කිරිම | 40.00 | 40.00 | - | - | 4 |
| 12 | ක්‍රිඩා භාණ්ඩ මිලදී ගැනීම | 64.00 | 64.00 | - | - | 7 |
| 13 | ක්‍රීඩාංගණ සඳහා යන්ත්‍ර සූත්‍ර සහ උපාංග මිලදී ගැනීම | 6.00 | 6.00 | - | - | 7 |
| 14 | එළිමහන් ක්‍රීඩාංගණයේ කායවර්ධන ශාලාව ප්‍රතිසංස්කරණ කිරීම, ප්‍රධාන ගොඩනැගිල්ලේ කාමර සහ වැසිකිලි පද්ධති නවීකරණය කිරීම. | 25.00 | 25.00 | - | - | 5 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 15 | ටිකට් කවුළු නවීකරණය කිරීම හා පැමිණීමේ දොරටු අලුත්වැඩියාව | 5.00 | 5.00 | - | - | 3 |
| 16 | එළිමහන් ක්‍රීඩාංගනය සඳහා ගිනි නිවන පද්ධතියක් ස්ථාපනය කිරීම. | 5.00 | 5.00 | - | - | 25 |
| 17 | පිහිණුම් තටාකය සඳහා විද්‍යුත් කාල ගණක පද්ධතියක් සවි කිරීම | 100.00 | 100.00 | - | - | 2 |
| 18 | ප්‍රධාන ක්‍රීඩාගාරයේ සියලු වීදුරු දොරවල් අලුත්වැඩියාව හෝ අලුතින් දැමීම,ප්‍රධාන ක්‍රීඩාගාරයේ ජනෙල් සහ බිඳී ඇති වීදුරු අලුත්වැඩියාව | 5.00 | 5.00 | - | - | 5 |
| 19 | මාර්ග කාපට් කිරීම සහ සලකුණු කිරීම, එළිමහන් පැසිපන්දු පිටිය නවීකරණය, මැන්හෝල් ආවරණ සවි කිරීම, නාම පුවරු(Name Boards, Sign Boards) සහ භූමි අලංකරණය(SIS & SOS) | 50.00 | 50.00 | - | - | 5 |
| 20 | බෝගම්බර ක්‍රීඩා පිටිය නවීකරණය කිරීම | 10.00 | 10.00 | - | - | 1 |
| 21 | බෝගම්බර ක්‍රීඩාංගණයේ ප්‍රධාන අමුත්තන්ගේ පීඨිකාව සඳහා ආසන මිලදී ගැනීම | 0.50 | 0.50 | - | - | 100 |
| 22 | කායවර්ධන මධ්‍යස්ථාන(බෝගම්බර සහ ගෘහස්ථ ක්‍රීඩාංගන) සඳහා ව්‍යායාම් උපකරණ මිලදී ගැනීම | 9.80 | 9.80 | - | - | 2 |
| 23 | බෝගම්බර ක්‍රීඩාංගණයේ ගොඩනැගිලි, විසිරි ජල පද්ධතිය නවීකරණය සහ ජල ටැංකියක් ස්ථාපනය කිරීම | 24.00 | 24.00 | - | - | 8 |
| 24 | ක්‍රීඩා හෝටලයේ නාන කාමර, වැසිකිළි අලුත්වැඩියා කිරීම හා ජල ටැංකියක් ස්ථාපිත කිරීම | 13.50 | 13.50 | - | - | 30 |
| 25 | ERP පද්ධතියක් මිලදී ගැනීම | 15.80 | 15.80 | - | - | 5 |
| 26 | පුහුණුව හා ධාරිතා සංවර්ධනය | 1.50 | 1.50 | 0.59 | 39 | 45 |


## 9. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 2025.09.30 දිනට

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මි.) | 2023.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | (රු.මි.) | (%) |
| පුනරාවර්තන වියදම | 466.00 | - | 332.73 | 71 |
| ප්‍රාග්ධන වියදම | 1,000.00 | - | 81.55 | 8 |
| **එකතුව** | **1,466.00** | **-** | **414.28** | **28** |

## 10. 2025 වර්ෂය තුළ ලබාගත් විශේෂ ජයග්‍රහණ (ඡායාරූප ද සමඟ)

i. රු.මි. 20.00 ක් පමණ වැයවෙතැයි ඇස්තමේන්තු කරන ලද ගෘහස්ථ ක්‍රීඩාංගණයේ සිවිලිම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තාවකාලික පිළියමක් යෙදීමට සැලසුම් කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහයෝගය ලබා ගනිමින් රු.මි. 1.40ක පිරිවැයක් දරමින් මේ සඳහා ආරක්ෂිත දැලක් යොදමින් සම්පූර්ණ කරන ලදී.





ii. ගෘහස්ත ක්‍රීඩාංගණයේ සම්පූර්ණ ගිනි නිවීමේ ආරක්ෂක පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා 2025 වර්ෂය සඳහා රු.මි. 4.50 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කොට තිබුණි. මෙම කටයුත්ත සඳහා ද ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහය ලබා ගනිමින් ආයතනය මඟින් අවශ්‍ය ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ ගුවන් හමුදාව වෙත ලබා දී මෙම කටයුත්ත නොමිලේ කර ගනිමින් පවතී.

iii. ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුතු මීටර් 400 / මීටර් 200 හා මීටර් 80 කෘතීම ධාවන මංතීරුව නැවත ඇතිරීම සහ අදාළ යටිතල පහසුකම් නවීකරණය යන ව්‍යාපෘතිය සඳහා අංග 04 ක් යටතේ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදුකල ද එහි පාපන්දු පිටිය නවීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා

ගුවන් හමුදාවේ සහය ලබා ගනිමින් අප විසින් අවශ්‍ය ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ ඔවුන් වෙත ලබා දී මෙම කටයුත්ත නොමිලේ කර ගනිමින් පවතී.

iv. ආයතනය සඳහා අවශ්‍ය තීන්ත ලබා ගැනීම සඳහා JAT ආයතනය සමඟ රු.මි.50.00 ක ගිවිසුමකට එළඹීම.







v. එළිමහන් ක්‍රීඩාංගණයේ නවීකරණය කරන ලද මාධ්‍ය ගොඩනැගිල්ල







## 11. 2026-2029 ඉදිරි ඉලක්ක

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ ක්‍රීඩා පහසුකම් සපයන ප්‍රමුඛ පෙළේ ක්‍රීඩා සංකීර්ණයක් වන බැවින්, ක්‍රීඩාවේ අභිවෘද්ධිය  සහ එම කටයුතු වලට සහය වීම පිණිස පරිපාලන කටයුතු හා සම්බන්ධ වෙමින් 2026-2029 වසර තුළ පහත සඳහන් ඉලක්ක සපුරා ගැනීම සඳහා අවධානය යොමු කර ඇත.

i. නවීන ක්‍රීඩා පහසුකම් සැපයීම සඳහා භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම.
ii. පුහුණුවීම් සහ ඉසව් සඳහා පහසුකම් සැලසීම සඳහා ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම/නඩත්තු කිරීම.
iii. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය තුළ ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතා කරන්නන්ගේ භාවිතය/ සංඛ්‍යාව වැඩි කිරීම.
iv. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා සුදුසුකම් ලත් උපදේශකයින් / පුහුණුකරුවන් සැපයීම.
v. ආදායම තවදුරටත් ප්‍රවර්ධනය කර ගැනීම සඳහා අධිකාරියේ ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතා කිරීම සහ එමගින් රජය විසින් ආයතනයට දරනු ලබන පිරිවැය අවම කිරීම.
vi. පාසල්, ක්‍රීඩා සමාජ සහ ක්‍රීඩා සංකීර්ණවල ක්‍රීඩා පහසුකම් කළමනාකරණය සඳහා උපදෙස් ලබා දීම සහ තාක්ෂණික සහාය ලබා දීම.
vii. ක්‍රීඩා යටිතල පහසුකම් සහ විකුණුම් ආදායම වැඩි කිරීමෙන් 2027 වර්ෂය අවසානය වන විට ආයතනික ආදායම් සහ වියදම් සමාන මට්ටමකට ළඟා වීම.

# ක්‍රීඩා වෛද්‍ය ආයතනය

# ක්‍රීඩා වෛද්‍ය ආයතනය

## 01. හැඳින්වීම

ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික හා මානසික නිරෝගී බව පවත්වාගෙන යාම, ඔවුන්ගේ රෝග නිවාරණය ආබාධ කළමනාකරණය ,ක්‍රීඩා පෝෂණය සහ ක්‍රීඩා හා ව්‍යායාම වෛද්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ සිදු කරමින් මෙරට ක්‍රීඩාව දියුණු කිරීම යන අරමුණු ඇතිව ක්‍රීඩා වෛද්‍ය ආයතනය ස්ථාපනය කර ඇත. පාසල් මට්ටමේ සිට ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා පවත්වනු ලබන සියළු ක්‍රීඩා තරඟාවලින් සඳහා වෛද්‍ය ආවරණ සැපයීමත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත ක්‍රීඩාවට අදාල සියළු වෛද්‍ය පහසුකම් ලබා දීමත් මේ තුලින් සිදු වේ.

හදිසි ප්‍රතිකාර අංශය හා බාහිර රෝගී අංශය, පුනරුත්ථාපන අංශය, කායික යෝග්‍යතා අංශය, ජෛව යාන්ත්‍රණ හා පර්යේෂණ සහ සංවර්ධන යන අංශ එක්ව සේවා පවත්වා ගෙන යන අතර ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ක්‍රීඩා වෛද්‍ය විද්‍යා පර්යේෂණ සිදු කිරීම හා ලොව දියුණු රටවල භාවිත වන නවීන ක්‍රීඩා තාක්ෂණය මෙරට තුළ යොදා ගැනීමෙන් ක්‍රීඩාවේ ජාත්‍යන්තර ජයග්‍රහණ අත්කර ගැනීමට උපරිම දායකත්වයක් ලබාදිමට ක්‍රීඩා වෛද්‍ය ආයතනය කටයුතු කරයි. තවද මානව කාර්ය සාධන විද්‍යාගාරය ස්ථාපනය කර ඇති අතර එහි ජෛව යාන්ත්‍රණ අංශය සම්පූර්ණ විමත් සමඟම මෙරට ක්‍රීඩාවේ උන්නතිය සඳහා අංග සම්පූර්ණ මානව කාර්ය සාධන විද්‍යාගාරයක පහසුකම් ද ක්‍රීඩකයින් වෙත ලබා දීමට ක්‍රීඩා වෛද්‍ය ආයතනයට හැකිවනු ඇත.

## 02. දැක්ම

"ක්‍රීඩා සහ ව්‍යායාම වෛද්‍ය විද්‍යාව තුළින් පරිපූර්ණ සෞඛ්‍ය සේවාවක් ලබාදීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛයා වීම."

## 03. මෙහෙවර

ක්‍රීඩා හා ව්‍යායාම විද්‍යාව, සායනික, පර්යේෂණ, අධ්‍යාපන යන අංශ ඔස්සේ සාකල්‍ය ප්‍රවේශයක් මඟින් ලබා දී සෞඛ්‍ය හා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේ ශ්‍රී ලංකාවේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය ලෙස සංවර්ධනය කිරීම.

## 04. අරමුණු

i. සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සෞඛ්‍ය හා කායික යෝග්‍යතාව ඉහළ නැංවීම තුළින් ඔවුන් ජාත්‍යන්තරය තුළ ක්‍රීඩාවෙන් ඉතා ඉහළ මට්ටමකට ගෙන ඒම.

ii. ක්‍රීඩා විද්‍යාව හා නවීන තාක්ෂණය උපයෝගි කරගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් හඳුනා ගැනීම හා ඔවුන් විසින්ම උරුම කරගනු ලැබූ හැකියාවන් වර්ධනය කිරීම සඳහා මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත කර ඉන් උපරිම ප්‍රතිඵල මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත ලබාදීම .

iii. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පූර්ව සහභාගිත්ව වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම තුළින් ඔවුන්ගේ ගැටළු හඳුනා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීම.

iv. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික යෝග්‍යතාව හා පෝෂණ මට්ටම වරින්වර මැන බැලීම, කායික යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හා පෝෂණ සටහන් ලබා දීම තුළින් කායික යෝග්‍යතාවය සහ පෝෂණය වැඩිදියුණු කිරීම.

v. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මානසික සෞඛ්‍ය වර්ධනය කරමින් ක්‍රීඩාවට උචිත ජයග්‍රාහී මානසික තත්ත්වයක් ළඟා කරදීමට උපදේශන හා මඟ පෙන්වීම .

vi. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ මට්ටම ක්‍රීඩාවට උචිත පරිදි ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම .

vii. ක්‍රීඩාවේදි අවශ්‍ය ප්‍රථමාධාර භාවිතය පිළිබඳව පුහුණුකරුවන් හා වෛද්‍ය සහායකයන් දැනුවත් කිරීම සඳහා අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

viii. දේශීය හා විදේශීය වශයෙන් පවත්වනු ලබන තරඟාවලි සඳහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රථමාධාර හා වෛද්‍ය ආවරණ සැපයීම.

ix. ක්‍රීඩා විද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ දෙස් විදෙස් විද්වතුන් සමඟ පර්යේෂණ පැවැත්වීම හා ඒ තුළින් ලබා ගන්නා දැනුමෙන් මෙරට ක්‍රීඩාව උසස් මට්ටමකට ගෙන ඒම.

x. ක්‍රීඩා හා ව්‍යායාම ක්ෂේත්‍රයට ක්‍රීඩා වෛද්‍ය විද්‍යාවේ දැනුම හා මාර්ගෝපදේශ ලබාදීම තුළින් නිරෝගී ප්‍රජාවක් බිහි කිරීම සඳහා දායක වීම.

## 05. ප්‍රධාන කාර්යයන්

i. ක්‍රීඩා ආබාධ වැළැක්වීම සහ කළමණාකරණය කිරිම සඳහා කටයුතු කිරීම
ii. විශේෂඥ වෛද්‍ය සායන පැවැත්වීම
iii. කායික යෝග්‍යතා පරීක්ෂණ සිදු කිරීම
iv. මානව කාර්ය සාධන විද්‍යාගාරය මඟින් ක්‍රීඩකයින්ගේ ජෛව තාක්ෂණය සම්බන්ධව සහ, හෘදය සහ පෙනහළුවල දරා ගැනීමේ හැකියාව සම්බන්ධව සහ පරීක්ෂණ සහ පර්යේෂණ කිරීම.
v. ක්‍රීඩා පෝෂණ හා ක්‍රීඩා මානසික උපදේශණය
vi. ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟාවලි සඳහා වෛද්‍ය හා ප්‍රථමාධාර ආවරණය
vii. ක්‍රීඩා අධ්‍යාපනය හා පර්යේෂණ සිදු කිරීම
viii. විනෝදාත්මක ක්‍රීඩා සඳහා යොමු වූ පුද්ගලයින් සඳහා ක්‍රීඩා හා ව්‍යායාම සම්බන්ධව උපදෙස් සහ වෛද්‍ය පහසුකම් ලබාදීම.
ix. දෙස් විදෙස් විද්වතුන් හා ආයතන සමඟ ක්‍රීඩාව හා පෝෂණය සම්බන්ධ පර්යේෂණ වෙනුවෙන් අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම.

## 06.මානව සම්පත් පැතිකඩ

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | 10 | 06 | 04 |
| **තෘතීයික** | 05 | 03 | 02 |
| **ද්විතියික** | 20 | 17 | 03 |
| **ප්‍රාථමික** | 41 | 37 | 04 |
| **එකතුව** | **76** | **63** | **13** |

## 07. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය (2025.09.30 දිනට)

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන්කළ මුදල (රු.මි) | 2025.09.30දිනට | | |
|---|---|---|---|---|---|
| | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
| **1** | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2.00 | 1.90 | 95 | 10045 |
| **2** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සංවර්ධනය | 1.00 | 1.00 | 100 | 100 |
| **3** | වාහන - වැඩිදියුණු කිරිම | 1.00 | 0.74 | 74 | 80 |
| **4** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම | 1.00 | 0.42 | 42 | 90 |
| **5** | මානව සම්පත් සංවර්ධනය-කාර්ය මණ්ඩල පුහුණු | 1.00 | 0.43 | 43 | 70 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | පර්යේෂණ හා සංවර්ධන | 10.00 | 0.47 | 5 | 40 |
| 7 | වෙනත් -<br>ඉහල දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහල නැංවීමේ ව්‍යාපෘතිය | 4.00 | 1.33 | 33 | 100 |
| 8 | වෙනත් -<br>ක්‍රීඩා පාසල් හා ක්‍රීඩා දක්ෂතා සහිත අනෙකුත් පාසල් සඳහා ක්‍රීඩා පෝෂණය හා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය | 3.00 | 0.60 | 20 | 60 |
| 9 | වෙනත් -<br>පුහුණුකරුවන් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය | 5.00 | 0.31 | 6 | 60 |
| 10 | වෙනත් -<br>ආයතනයේ වෙබ් පිටුව සැකසීම හා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සැකසීම (2023- බිල්පත් පියවීම ) | 1.00 | 0.85 | 85 | 80 |
| 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් - ආයතනය සඳහා CCTV, ඇතුළු වෙනත් පද්ධතින් ස්ථාපනය කිරීම | 2.00 | 1.79 | 90 | 100 |
| | | **31.00** | **9.85** | **32** | **60** |

**08.** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | 2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|
| | | (රු.මි.) | (%) |
| පුනරාවර්තන වියදම | 136.20 | 116.40 | 85 |
| ප්‍රාග්ධන වියදම | 31.00 | 9.85 | 32 |
| **එකතුව** | **167.2** | **126.25** | **76** |

**09. 2025 වර්ෂය තුළ ලබාගත් ඉලක්ක හා විශේෂ ජයග්‍රහණ**

- **ඉහල දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහල නැංවීමේ ව්‍යාපෘතිය**

මෙරට තුල හඳුනාගත් ඉහල කාර්යසාධනයක් සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික හා මානසික සෞඛ්‍ය හා පෝෂණය සම්බන්ධ ගැටළු නිසියාකාරව හඳුනාගැනීමත් ඒවාට පිළියම් යෙදීමත් තුළින් ඔවුන්ගේ කුසලතාවයන් වැඩි දියුණු කරමින් ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණයන් සඳහා යොමුවීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ඉහල කාර්යසාධනය සඳහා අවශ්‍ය පෝෂණ තත්වය පවත්වා ගැනීමට ක්‍රියා කිරීම සඳහා ඒ සම්බන්ධව ප්‍රමාණික දැනුම ඇති විශ්ව විද්‍යාල ආචාර්ය මහාචාර්යවරුන්ගෙන් යුත් කමිටුවක සහාය ඇතිව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය

මැනබැලීම, ඉහල කාර්යසාධන තත්වයන්වල සිටින ක්‍රිඩක ක්‍රිඩිකාවන් සඳහා පෝෂණ උපදෙස් හා පෝෂණ ගැටළු හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිකර්ම ක්‍රියාවට නැංවීම මේ තුළින් සිදුවේ.









### i. ක්‍රීඩා පාසල් හා ක්‍රීඩා දක්ෂතා සහිත අනෙකුත් පාසල් සඳහා ක්‍රීඩා පෝෂණය හා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුවත් කිරිමේ ව්‍යාපෘතිය

පාසල් ක්‍රීඩකයින්ගේ පෝෂණ තත්ත්වය හා පෝෂණය සම්බන්ධ දැනුම පරීක්ෂා කිරීම සහ ඔවුන්හට පෝෂණීය ආහාර වේලක් ලබා දීම සහ ඒ සම්බන්ධ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ක්‍රීඩා වෛද්‍ය ආයතනය හා ශ්‍රී ලංකා පෝෂණ වෛද්‍ය සංගමය එක්ව පළාත් නවය තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

පාසල් වෙත ගොස් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මූලික පෝෂණ විශ්ලේෂණයන් සිදු කර ආහාර සම්බන්ධ ගැටළු නිරාකරණය කරදීම, ක්‍රීඩකයන්ට ආහාර සපයනු ලබන පාසල් වල උචිත පරිදි ආහාර වට්ටෝරු සංශෝධනය කර ලබා දීම, මූලික වෛද්‍ය පරීක්ෂණයට බඳුන් කර ඔවුන්ගේ ක්‍රීඩා ආබාධ හඳුනා ගැනීම, එම මොහොතේ ලබාදිය හැකි වෛද්‍ය උපදෙස් ලබාදීම සහ විශේෂ වෛද්‍ය පරීක්ෂණ හෝ ප්‍රතිකාර කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා ප්‍රාදේශීය රෝහල් වෙත යොමු කිරීම මෙහිදී සිදු වේ. ඒ අනුව මේ වන විට උතුරු මැද පළාතේ හා බස්නාහිර පළාතේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර ඉතිරි පළාත් වෙත යාමට කටයුතු කරමින් සිටී.

හේනේගම මධ්‍ය මහා විද්‍යාලය



හොරණ තක්ෂිලා මහා විද්‍යාලය



පොළොන්නරුව රාජකීය විද්‍යාලය



රඹෑව මහා විද්‍යාලය



- **පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන**

පළාත් මට්ටමින් පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීම, නූතන තාක්ෂණික දැනුම ඔවුන්ට අත්පත්කර ගැනීමට අවකාශය සැලසීම, නිවැරදි තාක්ෂණික දැනුම ලබා දීම, අඩු වියදම් තාක්ෂණික උපකරණ සහ ශාරීරික බර උපයෝගී කර ගනිමින් ශක්තිවර්ධනය සහ ශාරීරික යෝග්‍යතාවට සම්බන්ධ දැනුම වැඩි කිරීම සඳහා නූතන තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳ දැනුවත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

මෙහිදී ක්‍රීඩාවේ ආබාධ අඩුකර ගැනීම, ආබාධ කළමනාකරණය කර ගැනීම සහ දක්ෂතා වර්ධනයට අවශ්‍ය තාක්ෂණික උපදෙස් සැපයීම සිදු කරන අතර පළාත් නවය සඳහා ම ප්‍රායෝගික හා න්‍යායාත්මක වැඩසටහන් ක්‍රියාත්මක වේ.

උතුරු මැද පළාත





**ii.** **මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත කිරිම**

මෙරට ක්‍රිඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තරය ජය ගැනීමට යාමේ දී ක්‍රීඩා විද්‍යාව, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, නූතන තාක්ෂණය හා යාන්ත්‍රණ විද්‍යාව භාවිතයෙන් දියුණු වූ රටවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමඟ තරඟ වැදීමට සිදුවේ. එහිදී එය ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඌන උපයෝගීතාවක් ලෙස මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත අහිතකරව බලපායි. එම ශිල්ප භාවිතා නොකිරීම මෙන්ම පුහුණුව සඳහා නූතන තාක්ෂණික ක්‍රම, නූතන තාක්ෂණික යන්ත්‍ර උපයෝගී කර නොගැනීම, ක්‍රීඩාවේ අනතුරු වලක්වා ගැනීමට අවස්ථාවත් නොමැති වීම හා පුනරුත්ථාපනයෙන් පසු කඩිනමින් ක්‍රීඩාව සඳහා යොමු වීමට ඇති හැකියාව අහිමි වීම ද මෙරට ක්‍රීඩාවට අහිතකරව බලපා ඇත.

මෙවන් තත්ත්වයක් තුළ අංග සම්පූර්ණ මානව කාර්ය සාධන විද්‍යාගාරයක් අප රටේ ස්ථාපිත කර ඉහත අහිතකර තත්වයන් ඉවත්කර ගැනීමට ක්‍රීඩා වෛද්‍ය ආයතනය කටයුතු කරගෙන යයි.






- **ජාතික හා ජාත්‍යන්තර තරඟාවලී සඳහා වෛද්‍ය ආවරණය සැපයීම.**

  ජාතික මහා ක්‍රීඩා උළෙල ඇතුළු ප්‍රධාන ක්‍රීඩා තරඟාවලී සඳහා (ජාතික හෝ ජාත්‍යන්තර) වෛද්‍ය ආවරණ සැපයීම ක්‍රිඩා වෛද්‍ය ආයතනයේ ප්‍රධානතම සේවාවක් වේ. මේ වසරේ ද මේ වන විට ජාතික මට්ටමේ තරඟාවලීන් 166 ක් හා ජාත්‍යන්තර තරඟාවලී 28 ක් පමණ ආවරණය කර ඇත.

  වෛද්‍ය, හෙද, භෞත චිකිත්සක හා සම්බාහක ඇතුළු පූර්ණ ප්‍රථමාධාර කණ්ඩායමක් විසින් මෙම සියළු වෛද්‍ය ආවරණයන් සපයනු ලබයි.





iii. ආයතනය වෙත පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා හදිසි ප්‍රතිකාර හා බාහිර රෝගී ප්‍රතිකාර, රසායනාගාර පරීක්ෂණ, භෞත චිකිත්සක හා සම්බාහක ප්‍රතිකාර, ක්‍රීඩා පෝෂණ හා ක්‍රීඩා මානසික උපදේශනය ඇතුළු සේවාවන් රාශියක් සපයනු ලබයි.

ඒ අනුව මෙම වසරේ දී පහත පරිදි සේවාවන් සපයා ඇත.

| හදිසි ප්‍රතිකාර හා බාහිර රෝගී අංශය | රසායනාගාර අංශය | පුනරුත්ථාපන අංශය | | ක්‍රීඩා පෝෂණය | කායික යෝග්‍යතා පරීක්ෂණය | වෛද්‍ය ආවරණ | |
|---|---|---|---|---|---|---|---|
| | | භෞත චිකිත්සක | සම්බාහක | | | දේශීය | විදේශීය |
| 8626 | 629 | 4552 | 3946 | 1917 | 1048 | 166 | 28 |

## 10. 2025-2029 ඉදිරි ඉලක්ක

i. මානව කාර්ය සාධන විද්‍යාගාරය ස්ථාපිත කිරීමෙන් එහි සියළු පහසුකම් මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත ලබාදීම හා භෞත චිකිත්සක අංශය සඳහා සපයා ගන්නා පුනරුත්ථාපන හා ජෛව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් ක්‍රීඩාවේ නවීණ තාක්ෂණය මෙරට ක්‍රීඩාව නගා සිටුවීම සඳහා යොදා ගැනීම.

ii. ක්‍රීඩකයින් වෙහෙසකර ව්‍යායාමවලින් පසු හැකි ඉක්මනින් යථාත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රීඩා වෛද්‍ය ආයතනය තුල රිකවරි ඒකකයක් හා හයිඩ්‍රොතෙරපි ඒකකයක් ස්ථාපනය කිරීම.

iii. වයඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා පෝෂණ වේදීන්ගේ සංගමය, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුම් ඇති කරගෙන මේ වන විටත් කටයුතු කරමින් සිටින අතර පේරාදෙණිය, මොරටුව හ ජයවර්ධනපුර විශ්ව විද්‍යාල හා ජයවර්ධනපුර රෝහල ඇතුළු ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාල විද්වතුන්ගෙන් යුත් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම තුළින් ක්‍රීඩා හා ව්‍යායාම සම්බන්ධව පර්යේෂණ කිරීම, දැනුම හුවමාරු කර ගැනීම හා අනාගතයේ දී මෙරට ක්‍රීඩාව දියුණු කිරීම.

iv. ක්‍රීඩා සම්භාහක පාඨමාලාව NVQ 4 මට්ටම සිට NVQ 5 දක්වා යාවත්කාලීන කිරිම හා ක්‍රීඩා සම්බාහකයින් පුහුණු කිරීම.

v. ක්‍රීඩා වෛද්‍ය ආයතනය ආදායම් උත්පාදක ආයතනයක් බවට පත් කිරීම.